# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# University of Sri Jayewardenepura

# බාහිර උපාධි පාඨමාලා විවරණිකාව 2022
# Prospectus For External Degrees 2022


මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
Faculty of Humanities and Social Sciences

# 2022 මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා බාහිර උපාධි විවරණිකාව

# FOR EXTERNAL DEGREE PROGRAMMES

## 2022

## මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

## බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකය

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**University of Sri Jayewardenepura**

## විශ්වවිද්‍යාලයීය ලාංඡනය - The Emblem of the University

---

## විශ්වවිද්‍යාලයීය ආදර්ශ පාඨය - The Motto of the University

**"විජ්ජා උප්පතතං සෙට්ඨා"**

---

## විශ්වවිද්‍යාලයීය දැක්ම - The Vision of the University

අධ්‍යාපනයෙන් ජීවිත සෞභාග්‍යවත් කිරීම

---

## විශ්වවිද්‍යාලයීය මෙහෙවර - The Mission of the University

අපගේ සංස්කෘතික උරුමයන්ගෙන් හා ඥානයන්ගෙන් ප්‍රබෝධයට පත් වෙමින් අධ්‍යාපනය ඇසුරෙන් තිරසර අනාගතයක් උදෙසා ගෝලීයව සාර්ථක පුරවැසියන් නිර්මාණය කිරීම

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ගීතය
# Anthem of University of Sri Jayewardenepura



ශ්‍රී ලංකා පින්බර රන් දෙරණේ
ශ්‍රී නිවාස වූ මහ අගනගරේ
ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ
ශ්‍රී නාමය රඳවවූ ලෝ මුදුනේ

හික්කඩුවේ සිරි සුමඟල් සමිඳුන්
වැලිවිටියේ සෝරත බඳු යතිඳුන්
බිහිකළ විද්‍යෝදය විදු බිම දුන්
එළියෙන් - දිවි මග සරසවූ

අයුක්තියේ දී විවාදශීලී
අසත්‍යයේ දී විචාරශීලී
වියත් සබා මැද සමාජශීලී
වියතුන් වී දැය පොබයවූ
විජ්ජා උප්පතතං සෙට්ඨා..//

**ගේය පද රචනය**
සේවාර්පිත මහාචාර්ය සුනිල් ආරියරත්න

**තනු නිර්මාණය සහ සංගීතය**
ආචාර්ය රෝහණ වීරසිංහ

# මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා බාහිර උපාධි විවරණිකාව

## 2022

## මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ISBN-978-955-9054-73-3

**සංස්කරණය**

පූජ්‍ය මහාචාර්ය පින්නවල සංඝසුමන හිමි - (අධ්‍යක්ෂ - බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකය )
ආචාර්ය එම්.ඒ.එස්. විජේසිංහ - (සභාපති - මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ අධ්‍යයන මණ්ඩලය )

**සම්බන්ධීකරණය**

එල්.එල්. වසන්ත පෙරේරා (නියෝජ්‍ය ලේඛකාධිකාරී - බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකය)

ඒ. ඩී. එස්. සමාදරී (සහකාර ලේඛකාධිකාරී - බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකය)

**පිට කවරය**

යසිරු ද සිල්වා (වැඩසටහන් සම්පාදක - බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකය)

## වැඩ බලන උපකුලපතිතුමන්ගේ පණිවිඩය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



දැනුමින් සන්නද්ධ විනයගරුක බුද්ධිමතුන් බිහි කිරීම ප්‍රමුඛතම පරමාර්ථය කරගත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වර්තමානයේ ශ්‍රී ලංකාවේ වැඩිම සිසුන් පිරිසක් අධ්‍යාපනය හදාරනු ලබන විශ්වවිද්‍යාලය බවට පත්ව ඇත. කීර්තිමත් රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන අප හා එක්ව ඔබගේ ජීවිතයේ අධ්‍යාපනික කඩඉම් පසු කරමින් විශිෂ්ටත්වය කරා යන ගමනට විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපතිවරයා ලෙස පළමුවෙන් සුභාශිංසන එක් කරනු කැමැත්තෙමි. එවකට සුපතළ පිරිවෙනක් වන විද්‍යෝදය පිරිවෙන මුල් කරගනිමින් බිහි වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, වර්තමානයේ විශ්වවිද්‍යාල අතරින් කීර්තිමත් නාමයක් අත් කර ගෙන ඇත්තේ ඒ හරහා බිහිවන බුද්ධිමත්, විනයගරුක සහ ඕනෑම අභියෝගයක් ජයගත හැකි විශිෂ්ටතමයින් සියළු ක්ෂේත්‍ර නියෝජනයට සක්‍රියව දායක වන බැවිනි.

අතීතයේ පටන්ම ප්‍රබුද්ධ සහ කීර්තිමත් ආචාර්යවරුන්ගේ පහස ලත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මගින් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය, ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය සහ සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව යන උපාධි ත්‍රිත්වය හැදෑරීමේ වරම් ඔබට හිමිවේ. එනමුදු ඔබට මෙම උපාධි පාඨමාලා හදාරා ඔබගේ උපාධි සිහිනය සැබෑ කර ගැනීම පහසු කර්තව්‍යයක් නොවන අතර තෙවසරක අභියෝගාත්මක කාලයක් ඒ සඳහා කැප කල යුතුවේ. මනා පුහුණුව ලත් ආචාර්යවරුන්ගේ නිබඳ සහය ඔබට ඔබගේ අරමුණ කරා ළඟාවීමට මඟපෙන්වනු ලබන අතර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් ඔබට අවශ්‍ය සියළු සහය සහ අවශ්‍ය තොරතුරු සුහදශීලී කාර්ය මණ්ඩලයක් හරහා නිරන්තරව ලබා දෙනු ඇත. අධ්‍යයන කටයුතු සිදු කිරීමේදී නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ ඔබගේ අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය සහය හා තොරතුරු ලබාදීම ද මෙහිදී සුවිශේෂී කරුණක් ලෙස දැක්විය හැකිය. සමාජ ප්‍රගමනය උදෙසා දැනුමින්, කුසලතාවෙන්, බුද්ධිමත්බවින් සහ විනයෙන් මනාව සංවිධාන වූ උපාධිධරයන් බිහිකිරීම ජාතියේ අවශ්‍යතාවයක් වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය එය මනා කළමනාකාරිත්වයකින් ඉටු කරනු ලබයි. තෙවසරක කාලය නොපසුබස්නා උත්සාහයෙන් යුතුව කටයුතු කර ඔබගේ ඉලක්ක ජයගැනීම ඔබ අත ඇති භාරදූර සමාජමය වගකීමකි. එම සමාජමය වගකීම ඔබ තරයේ අදිටන් කර ගත යුතුවේ. තෙවසරක අධ්‍යයන කාලය ඉතා ඵලදායී ලෙස ගත කරමින් දිනෙක තම වගකීම ඉටු කරනු වස් සෑම අතින්ම පිරිපුන් ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් උපාධිධාරියෙක් ලෙස බිහිවී ජයග්‍රහණයේ හිණිපෙති කරා ළඟා වීමට ඔබට සියළු ධෛර්යය ලැබේවායි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපතිවරයා ලෙස සුභාශිංසන එක්කරමි.

මහාචාර්ය උපුල් සුබසිංහ

වැඩබලන උපකුලපති

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල

## පීඨාධිපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ විශ්වවිද්‍යාල අතර මූලිකත්වයෙහිලා ගැනෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය විසින් අ.පො.ස. උසස් පෙළ විභාගය හොඳින් සමත් ඔබ, බාහිර උපාධි අපේක්ෂකයන් වශයෙන් සාදරයෙන් පිළිගනිමි. මානව සංවර්ධන නිර්ණායක අතින් බලන කල දියුණු වන රටවල් අතර, ශ්‍රී ලංකාවට විශේෂ තැනක් හිමි වන බව අපි දනිමු. මෙයට ප්‍රධානතම හේතුව වන්නේ අධ්‍යාපනය ලැබීම අතින් ශ්‍රී ලාංකික ජනතාව වඩාත් ඉහළ තත්ත්වයක පසුවීමයි. එසේ වුවද, තවමත් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන අතිදක්ෂ සිසුන්ගෙන් අභ්‍යන්තර සිසුන් වශයෙන් ජාතික විශ්වවිද්‍යාලවලට ඇතුළු වීමට වරම් ලැබෙන්නේ සුළු පිරිසකට නමුත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය "ඉගෙනුම තුළින් ජීවිත සමෘද්ධිමත් කිරීම" යන සිය දැක්මට අනුව අභ්‍යන්තර සිසුන්ට අමතරව දැයේ විශාල දරු දැරියන් පිරිසකට බාහිර උපාධි වැඩසටහන් මගින් උසස් අධ්‍යාපන අවස්ථා සලසමින් සිටී.එකී සේවාවේ පුරෝගාමී මෙහෙවර ඉටු කිරීමට මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයට හැකිවීම එදා මෙදාතුර ලැබූ ඓතිහාසික ජයග්‍රහණයකි. මේ වනවිටත් මෙම පීඨය විසින් බිහි කර ඇති උපාධිධාරීන් රටේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල විශාල සේවයක යෙදෙමින් සිටින බව සතුටින් ප්‍රකාශ කළ යුතුය. උපාධියක් ලැබීම යනු, හුදෙක් සහතිකයක් ලැබීම නොවේ. අදාල කාර්යයන්හි යෙදීමේදී ඔවුන් වඩාත් විශේෂිත දායකත්වයක් දැක්වීමට හැකියාව ඇත්තන් හෙවත්, වඩා ඉහළ ශ්‍රම ඵලදායිතාවෙන් හෙබි අය විය යුතුය. එවැනි උපාධිධාරීන් බිහි කිරීම වර්තමානයේ අප හමුවේ තිබෙන ප්‍රධාන අභියෝගයයි. මේ සඳහා අපගේ පීඨය සිසු පුහුණුව වැඩි කර ඔවුනට සමාජීය විද්‍යාඥයන් හෝ මානව ශාස්ත්‍රඥයන් ලෙස අවශ්‍ය වන අනෙකුත් කුසලතා ද වර්ධනය කිරීමේ විශේෂිත වැඩසටහනක් සකසා ඇත. මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයන්හි පුළුල් වූ පරාසයක් තුළ පාඨමාලා තෝරාගැනීමට මෙම පීඨයේ ලියාපදිංචි වන සිසුනට හැකියාව ඇත. කෙසේවෙතත්, අධ්‍යයන කාලය අවසානයේ සාර්ථක ලෙස උපාධිය නිම කිරීමේ වගකීම වැඩි වශයෙන් රැඳෙන්නේ සිසුන් වන ඔබ අත ම බව ද මතක තබාගත යුතුය. ඉගෙනුම තුළින් ජීවිත ආලෝකවත් කර ගැනීම සඳහා අවස්ථා සලසා දෙමින් අපි ඔබට සුබ පතන්නෙමු.

*මහාචාර්ය එස්.සී.බී. හීන්කෙන්ද*

*පීඨාධිපති,*

*මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය*

## අධ්‍යක්‍ෂ ස්වාමීන් වහන්සේගේ පණිවිඩය



ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකාවේ විශාලතම ජාතික විශ්වවිද්‍යාලය වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්‍ෂකත්වය ලැබූ ඔබට ප්‍රථමයෙන් ම බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙනුවෙන් සුභාසිංශනය පිරිනමමු. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ නිර්මාතෘවර අතිගෞරවාර්හ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේගේ දූරදර්ශී බුද්ධිප්‍රභාවෙහි සංකේතය බඳු මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය එදා මෙදාතුර බිහි කර ඇති අභ්‍යන්තර හා බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව අතිමහත් ය. ජාතික සංවර්ධනයට දායක වන වඩාත් කාර්යක්ෂමවූත් ප්‍රායෝගිකවූත් ශාස්ත්‍රඥයින් බිහි කරමින් හැටපස් වසරකට අධික අභිමානනීය ගමනක යෙදෙන මෙම පීඨයේ උපාධි පාඨමාලාවක් හදාරන්නට ලැබීම ඔබගේ අධ්‍යාපන ගමන් මගේ නොමැකෙන සිහිවටනයක් වනු ඇත.

තරඟකාරී රැකියා වෙළඳපොළ තුළ අභියෝග ජය ගත හැකි කලා උපාධිධරයකු බවට පත් වීමට නම් ඔබ හදාරන විෂය ක්ෂේත්‍රය මෙන්ම දැනුම ලබා ගන්නා ක්‍රමවේදය ද වෙනස් විය යුතු හෙයින්, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මඟින් විවිධත්වයෙන් යුතු බාහිර උපාධි පාඨමාලා ඔබ වෙත ඉදිරිපත් කර ඇත. කලා උපාධිධරයෙකු සතු විය යුතු බහු විෂයීය දැනුම අරමුණු කරගෙන ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා නව විෂය ගොනුගත ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර ඉංග්‍රීසි සහ තොරතුරු තාක්‍ෂණයට අදාල විෂය ඒකක හයක් ද වැඩ පාදක සීමාවාසික පුහුණුවක් ද ඊට අන්තර්ග්‍රහණය කර ඇත. මෙම ව්‍යුහාත්මක වෙනස තරඟකාරී ලෙස වැඩ ලෝකය ජය ගන්නට සමත් කලා උපාධිධරයකු බිහි කිරීමට මනා පිටිවහලක් වන බව නිසැක ය. එය හැරුණු විට ජාතික සංවර්ධනයේ දී අත්‍යවශ්‍ය අංශ තුනක් වන පරිසරය, සංවර්ධනය හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව සහිත උපාධිධරයෙක් බිහි කිරීමේ අරමුණින් සාර්ථකව පවත්වාගෙන යනු ලබන තවත් උපාධි පාඨමාලා දෙකක් ද ඔබ වෙත ඉදිරිපත් කර ඇත.

හිතාදර ශිෂ්‍ය ශිෂ්‍යාවනි, උසස් පෙළ විභාගය සමත්ව ඉතා සුලු ලකුණු ගණනකින් ජාතික විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු බවට පත්වීමට නොහැකි වූ ඔබට දැන් එකී අවස්ථාව වෙනත් අයුරකින් උදා වී ඇත. එම අභියෝගය ජය ගැනීමට හැකි කුසලතාවත්, මනා කැපවීමත්, උනන්දුවත්, නොපසුබට උත්සාහයත් ඔබ සතුව පවතින බැව් අපි තරයේම විශ්වාස කරමු. ඒ සඳහා සියලු පහසුකම් සපයා දෙමින් නව තාක්ෂණය සමඟ අත්වැල් බැඳගෙන මාර්ගගත හා මාර්ගගත නොවන ක්‍රමවේද ඔස්සේ ඉගැන්වීම් සහ ඇගයීම් සිදු කරමින් ඔබට සහාය වන්නට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය නිරන්තරයෙන් ඔබ සමග රැඳී සිටින බව අවධාරණය කරනු කැමැත්තෙමු. ඔබගේ නිර්මාණාත්මක කුසලතා කළ එළි දැක්වීමට අත දීමක් වශයෙන් ක්‍රියාත්මක වන විදුමිණි කුසලතා අභිවර්ධන ප්‍රයාසය බාහිර උපාධි අපේක්‍ෂකයකු වශයෙන් ඔබ ලබන මහාර්ඝ අවස්ථාවක් වනු ඇත. ජාතියේ අභිමානය ඉහළට ඔසවා තබන අර්ථපූර්ණ උපාධිධරයකු බවට පත් වීමේ නොතිත් අපේක්‍ෂාව ඉටු කර ගන්නට ඔබට දිරිය හා ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

තෙරුවන් සරණයි!

***පූජ්‍ය මහාචාර්ය පින්නවල සංඝසුමන හිමි***

***අධ්‍යක්ෂ - බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය***

## ලේඛකාධිකාරීතුමාගේ පණිවිඩය



2022 වර්ෂයට ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය, ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය  හා සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය සඳහා ඇතුලත් වූ නවක උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් සකස් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා විවරණිකාව වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.මෙරට ජාතික විශ්වවිද්‍යාල අතර ඉහලින්ම වැජඹෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි අපේක්ෂකයකු ලෙස ලියාපදිංචි වී උසස් අධ්‍යාපනය හැදෑරීමට ඔබ විසින් ගනු ලැබූ බුද්ධිමත් තීරණය මා සමස්ථ පරිපාලනය වෙනුවෙන් අගය කරමි. එය අප දකිනුයේ අප විශ්වවිද්‍යාලයේ ඉහල ගුණාත්මකභවකින් යුත් අධ්‍යයනය හා මනා කළමනාකරණය කෙරෙහි ඔබ තැබූ විශ්වාසයක් ලෙසිනි.

විශ්වවිද්‍යාලයීය ආචාර්ය මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ තුලින් බාහිර ශිෂ්‍යයෙකු වූ ඔබට ද අභ්‍යන්තර ශිෂ්‍යයෙකුට ලැබෙන ගුණාත්මක අධ්‍යාපනය ලබාදීමට අප කටයුතු කරනු ලබන අතර යෝජිත නව ගොඩනැගිලි සංකීර්ණයක් තුල ඔබට විශ්වවිද්‍යාල පරිසරයක අධ්‍යයන කටයුතු, පුස්තකාල පරිහරණය වැනි කාර්යයන් ද ලබාදීමට සැලසුම් සකස් කරමින් පවතී.

ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචියේ සිට උපාධි සහතිකය ලබාගැනීම දක්වා සමස්ථ ක්‍රියාවලිය තුල නවීන තාක්ෂණය භාවිතා කරමින් කඩිනම් හා සුහදශීලී සේවයක් ලබාදීමට සමස්ථ කාර්යය මණ්ඩලයම කැපවී සිටින බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

විශ්වවිද්‍යාලයේ මෙහෙවර ප්‍රකාශයේ සඳහන් වන ‘තිරසාර අනාගතයක් උදෙසා ගෝලීයව සාර්ථක පුරවැසියෙක්’ බවට ඔබව පත්කිරීමට අවශ්‍ය සියළුම පහසුකම් සමස්ථ පරිපාලනය ලෙස ලබාදීමට පොරොන්දු වෙමින් ඔබගේ උසස් අධ්‍යාපන සිහිනය සාර්ථක වේවා යැයි එකසිතින් ප්‍රාර්ථනා කරමි.

***ඒ.බී. වැලිවිට***
***ලේඛකාධිකාරී***
***ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය***

## පටුන


**1.** හැඳින්වීම.................................................................................................................................. 11

**2.** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය........................................................................ 12

**3.** බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව සහ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩල.................................................................................................................. 13

**4.** බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචිය................................................................................ 14

**5.** මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මඟින් බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය යටතේ ඉදිරිපත් කරනු ලබන උපාධි පාඨමාලා.................................................................. 19

5.1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව 21

5.2 ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව 39

5.3 සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව 46

**6.** ඉගැන්නුම් සහ ඉගෙනුම් ක්‍රියාවලිය…………………………………………………………… 49

**7.** ඇගයීම් ක්‍රමය…………………………………………………………………………………… 50

**8.** ශ්‍රේණි පටිපාටිය සහ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA)........................................................... 51

**9.** විභාග නිර්ණායක (GPA) සහ උපාධි ආවශ්‍යකතා................................................................... 54

**10.** පන්ති සාමර්ථ්‍යය ප්‍රදානය.......................................................................................................... 57

**11.** විභාග අක්‍රමිකතා ........................................................................................................................ 59

**12.** උපාධිය වලංගු වන දිනය.............................................................................................................. 60

# 1. හැඳින්වීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වූකලී ශිෂ්‍ය සංඛ්‍යාව අතින් මෙරට ඇති විශාලතම විශ්වවිද්‍යාලයයි. එය ආරම්භ වූයේ 1959 වර්ෂයේ දී වුවත් එහි අතීතය වර්ෂ 1883 දී හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණන් විසින් ආරම්භ කරන ලද එවකට දේශීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් වූ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන දක්වා ඈතට දිව යයි. වත්මන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආරම්භක අධ්‍යාපන ආයතනය වන්නේ එම විද්‍යාස්ථානයයි. එනයින් ගත් කල විශ්වවිද්‍යාලයේ ඉතිහාසය ශත වර්ෂයකටත් වඩා ඈතට දිව යයි. 1958 අංක 45 දරන විශ්වවිද්‍යාල පනතට අනුව **විද්‍යෝදය විශ්වවිද්‍යාලය** නමින් 1959 පෙබරවාරි 18 වන දින කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනෙහි ශ්‍රී සුමංගල මන්දිරයේ ශිෂ්‍යයින් 14 දෙනකුගෙන් ස්ථාපිත කරන ලද මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රථම විශ්වවිද්‍යාලයාධිපතීන් වහන්සේ ලෙස පත් වූයේ සාහිත්‍ය චක්‍රවර්ති, රාජකීය පණ්ඩිත අතිගෞරවාර්හ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේය. 1961 නොවැම්බර් 22 දින මාලිගාකන්දේ සිට වර්තමාන විශ්වවිද්‍යාල පරිශ්‍රය පිහිටා ඇති ගංගොඩවිල භූමි භාගය වෙත විශ්වවිද්‍යාලය රැගෙන එන ලදි. 1972 අංක 01 දරන ලංකා විශ්වවිද්‍යාල පනත මගින් සිදු කරන ලද සංශෝධන අනුව විද්‍යෝදය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යෝදය මණ්ඩපය වශයෙන් නම් කෙරිණි. දැනට ක්‍රියාත්මක 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත මගින් එය **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය** ලෙසින් යළිත් ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පත් විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වර්තමාන පීඨ සංඛ්‍යාව අටක් වුවත් එහි ආරම්භක යුගයේ දී පැවතියේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විෂයක්ෂේත්‍ර නියෝජනය කරන කලා, බෞද්ධ අධ්‍යයන, දර්ශනය සහ භාෂා යන පීඨයන් පමණි. 1966 වසරේ දී එකී පීඨ සතර ඒකාබද්ධ වෙමින් **ශාස්ත්‍ර පීඨය (කලා පීඨය)** බිහි වූ අතර ඒ යටතේ අධ්‍යයනාංශ 12 ක් ක්‍රියාත්මක වූ බව ඉතිහාසයේ දැක්වෙයි. මීට සමගාමීව පිළිවෙලින් 1966 දී සහ 1972 දී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියෙහි ප්‍රථම ව්‍යවහාරික විද්‍යා පීඨයත්, ප්‍රථම කළමනාකරණ පීඨයත් පිහිටුවමින් සීඝ්‍රයෙන් දියුණුවට පත්වන ජාතික විශ්වවිද්‍යාලයක් බවට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පත් විය. වසර 50 කට ආසන්න කාලයක් පුරා ලෝකප්‍රකට පඬිවරුන් බිහි කළ කීර්තිමත් පීඨයක් බවට පත්ව තිබූ ශාස්ත්‍ර පීඨය, **මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය** ලෙසින් 2011 වසරේ දී නාම සංශෝධනයකට ලක් විය. වර්තමානයේ අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි හා වාග්විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම, භූගෝල විද්‍යාව, ඉතිහාසය සහ පුරා විද්‍යාව, භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසාංගික කලා, සංගීතය හා නිර්මාණ තාක්ෂණ අධ්‍යනාංශය, පාලි හා බෞද්ධ අධ්‍යයන, මානව විද්‍යාව,දර්ශනය හා මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව, සිංහල හා ජනසන්නිවේදනය, සමාජ සංඛ්‍යානය සමාජ විද්‍යාව සහ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශ යන අධ්‍යයනාංශ 16 යටතේ අභ්‍යන්තර උපාධි පාඨමාලා 31 ක් ක්‍රියාත්මක වන අතර බාහිර උපාධි පාඨමාලා 03 ක් ක්‍රියාත්මක වෙයි. දළ වශයෙන් 3500 කට ආසන්න අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාවක් ද 100000 ට ආසන්න බාහිර ශිෂ්‍ය සංඛ්‍යාවක් ද වර්තමානයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය යටතේ ඉගෙනුම ලබති.

## 2. බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් බාහිර උපාධි පාඨමාලා පැවැත්වීමේ ඉතිහාසය එහි ආරම්භක අවධිය තෙක් ම දිව යයි. එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලය මගින් හඳුන්වා දුන් පාඨමාලා අතර ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව ද ඉතා ජනප්‍රිය වූවකි. ශාස්ත්‍රාභිලාශී විශාල පිරිසකට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉඩක් නොමැති වීමත්, මුල් අවධියේ දී අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස කාන්තාවන් බඳවා නොගැනීමත් බාහිර කලා උපාධි පාඨමාලාව හඳුන්වා දීමට හේතු විය. එවකට ලක්දිව ප්‍රකට විද්‍යායතන පිරිවෙන් මගින් විද්‍යෝදය බාහිර කලා උපාධි පාඨමාලාව සඳහා ඉගැන්වීම් සිදු කරමින් සුවිශාල දායකත්වයක් සපයන ලදී. 1972 සංශෝධනයට අනුව බාහිර උපාධි පාඨමාලා සහ ඊට අදාල විභාග පැවැත්වීම සඳහා සියලු විශ්වවිද්‍යාලවලට පොදු එක් බාහිර උපාධි ඒකකයක් ස්ථාපිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් දීර්ඝ කාලයක් පවත්වාගෙන ආ බාහිර උපාධි පැවැත්වීමේ අයිතිය විශ්වවිද්‍යාලයට අහිමි විය. 1978 සංශෝධනයෙන් පසුව යළිත් සීමිත අවස්ථාවක් හිමි වූ අතර ඒ අනුව ශාස්ත්‍රවේදී සහ විද්‍යාවේදී උපාධිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ද, වාණිජවේදී උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ද භාර කරමින් ප්‍රතිසංවිධානය විය. එයට සමගාමීව 1979 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා මෙහෙයවීම සඳහා **බාහිර උපාධි ඒකකය** නමින් වෙනම අංශයක් පිහිටුවන ලදී. 1991 දී නැවත වරක් ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලා පැවැත්වීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අවස්ථාව ලබාගත හැකි වූ අතර 1997 දී විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන හා ව්‍යාපාර පරිපාලන බාහිර උපාධි පාඨමාලා ද හඳුන්වා දෙනු ලැබීය. 2010 ඔක්තෝබර් මස 15 වන දින නිකුත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 932 ට අනුව ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාල මගින් පිරිනැමෙන බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම, පාඨමාලා මෙහෙයවීම හා කළමණාකරණය පිළිබඳ පුළුල් සංශෝධනයක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ එතෙක් ක්‍රියාත්මක වූ බාහිර උපාධි ඒකකය ව්‍යුහාත්මක වෙනසකට ලක්වෙමින් **බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය** බවට පත් විය. උපකුලපතිවරයාගේ වගකීම යටතේ ක්‍රියාත්මක වන අධ්‍යක්ෂවරයකු හා නියෝජ්‍ය අධ්‍යක්‍ෂකවරුන් තිදෙනකුගෙන් ද, පීඨාධිපතිවරු, අධ්‍යයනාංශ ප්‍රධානවරු, අධ්‍යයන මණ්ඩල සභාපතිවරු, පාඨමාලා සමායෝජකවරු හා දේශකවරුන් ප්‍රමුඛ අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් ද, ලේඛකාධිකාරීවරයා යටතේ ක්‍රියාත්මක නියෝජ්‍ය ලේඛකාධිකාරී,සහකාර ලේඛකාධිකාරී ඇතුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලයකින් ද, මූල්‍යාධිකාරී යටතේ ක්‍රියාත්මක ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීතුමියගෙන් ද මෙම ඒකකය සමන්විත වෙයි. බාහිර උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීමේ සිට උපාධි ප්‍රදානෝත්සවය දක්වා වූ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂමව සහ වගකීම් සහිතව පවත්වාගනු වස් උපකුලපතිවරයා සභාපතිත්වය දරණ කළමනාකරණ කමිටුවේ පූර්ණ පරිපාලනයට සහ අධීක්ෂණයට බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය යටත් වේ. බාහිර උපාධි පාඨමාලා සම්බන්ධ සියලුම අධ්‍යයන කටයුතු පිළිබඳ තීරණ ගැනීමේ දී උක්ත චක්‍රලේඛය අනුව පිහිටුවා ඇති අධ්‍යයන මණ්ඩල ද, ඒවාට අදාල පීඨ මණ්ඩල ද, අවසානයේ විශ්වවිද්‍යාලයීය සනාතන සභාව ද අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වෙයි. බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය බාහිර උපාධි අපේක්ෂකයන් සම්බන්ධ විශ්වවිද්‍යාලයේ ස්ථාපිත එකම ආයතනය වේ.

## 2.1 බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ප්‍රධාන කාර්යයන්

- බාහිර උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම.
- විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ දායකත්වය ලබාගෙන දේශන, විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ, ප්‍රායෝගික වැඩමුළු සංවිධානය කිරීම හා පැවැත්වීම.
- විභාග අයදුම්පත් කැඳවීම, විභාග කාල සටහන් සැකසීම, ප්‍රවේශ පත්‍ර සහ විභාග නීති මාලාව අපේක්ෂකයන් වෙත ලබාදීම.
- ප්‍රශ්නපත්‍ර මුද්‍රණය කිරීම සහ අදාල විභාග මධ්‍යස්ථාන වලට නිකුත් කිරීම, නියමිත දිනට විභාග පැවැත්වීමේ කටයුතු සංවිධානය කිරීම.
- විභාග ප්‍රතිඵල නිකුත් කිරීම.
- උපාධි ප්‍රදානෝත්සවය සංවිධානය කිරීම සහ පැවැත්වීම.
- තාවකාලික සහතික පත්‍ර, විස්තරාත්මක ශ්‍රේණි සහතික, මුද්‍රිත උපාධි සහතික සහ ප්‍රතිඵල සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම.

# 3. බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව සහ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩල

විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන බාහිර උපාධි සම්බන්ධ සියලුම පරිපාලන කටයුතු බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව මගින් මෙහෙයවනු ලැබේ. උපකුලපතිවරයා මෙහි සභාපති ධූරය හොබවන අතර, අදාල පීඨයන්හි පීඨාධිපතිවරුන්, අධ්‍යක්ෂ/ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, සමායෝජක/අධ්‍යයන පහසුකම්, සමායෝජක/ලියාපදිංචි කිරීම් හා විභාග, සමායෝජක/ඇගයීම් හා ශික්ෂණ සහායතා, ලේඛකාධිකාරි, මූල්‍යාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලක සභා නියෝජිතවරුන් දෙදෙනෙක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නියෝජිතවරයෙකු, පාඨමාලාවන්ට අදාල අධ්‍යයනාංශ ප්‍රධානවරුන් සහ පාඨමාලා සමායෝජකවරු, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී,සහකාර ලේඛකාධිකාරී සහ සහකාර මූල්‍යාධිකාරී මෙහි සාමාජිකයෝ වෙති. මෙම කළමනාකරණ කමිටුව විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක වන්නේ සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතියට යටත්වය.

මීට අමතරව, මානවශාස්ත්‍ර හා සමාජීයපීඨය සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයට අදාල බාහිර උපාධි පාඨමාලා වලට සම්බන්ධ සියලුම අධ්‍යයන කටයුතු පිළිවෙළින් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩලය සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදුවේ.

## 4. බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචිය

### 4.1 ලියාපදිංචිය සඳහා අයැදුම්පත් කැඳවීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා සඳහා උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම වාර්ෂිකව සිදු කෙරේ. මේ සඳහා පුවත්පත්, විද්‍යුත් මාධ්‍ය සහ සහ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නිල වෙබ් අඩවිය මගින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීම සිදු කරනු ලබන්නේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නිල වෙබ් අඩවිය මගින් වන අතර අයදුම්කරුවන් වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්පත් යොමු කළ යුතුය.

### 4.2 ලියාපදිංචිය සඳහා තෝරා ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛනයන්ට අනුකූලව අදාල අධ්‍යයන වර්ෂය සඳයා සීමිත උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. අයදුම්පත් ඉදරිපත් කරන ලද අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව සීමාව ඉක්මවා යන අවස්ථාවලදී 'Z' අගය මත හෝ ප්‍රවේශ පරීක්ෂණයක් මඟින් හෝ අදාල අධ්‍යයනාංශය මඟින් තීරණය කරනු ලබන වෙනත් ක්‍රමවේදයක් මඟින් නිශ්චිත ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා 01/2021 චක්‍රලේඛනයට අනුව විෂය ගොනුගත ක්‍රමය යටතේ එක් එක් විෂය සඳහා අයදුම් කරන ලද අපේක්ෂක සංඛ්‍යාව සීමාව ඉක්මවා යන අවස්ථාවලදී ඉහළම ලකුණු ලබා ගන්නා අය අතුරින් නිශ්චිත ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගනු ලැබේ. සංගීතය සහ නර්තනය විෂයයන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අපේක්ෂකයන්ට අදාල අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන ලිඛිත / ප්‍රායෝගික පරීක්ෂණයකින් හෝ අධ්‍යයනාංශය විසින් තීරණය කරනු ලබන නිර්ණායකයන්ට අනුව තෝරා ගැනීම සිදු කෙරේ. එම පරීක්ෂණවල දී අපේක්ෂිත මට්ටමට ළගා විය නොහැකි අයදුම්කරුවන්ට විෂය ගොනු ක්‍රමය යටතේ ඉදිරිපත් කරන ලද ඊළඟ වරණයට අනුව වෙනත් විෂයයක් තෝරා ගැනීමට සිදුවේ.

### 4.3 ලියාපදිංචි අංකය සහ ශිෂ්‍ය වාර්තා පොත නිකුත් කිරීම

ඉහත නිර්ණායක සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අදාල අධ්‍යයන වර්ෂයෙහි බාහිර උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබයි. එසේ සුදුසුකම් ලබා ගන්නා අයදුම්කරුවන් සඳහා ලියාපදිංචි අංකයක් සහිත ශිෂ්‍ය වාර්තා පොත නිකුත් කරනු ලැබේ.

බාහිර උපාධි පාඨමාලා සඳහා අයදුම් කර සුදුසුකම් සපුරා ඇති සෑම ශිෂ්‍යයෙකු සඳහාම ලියාපදිංචි කිරීමෙන් අනතුරුව ශිෂ්‍ය වාර්තා පොතක් විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරනු ලැබේ. සිය අධ්‍යයන කටයුතු කරගෙන යාමේ දී විශ්වවිද්‍යාලය සමඟ කෙරෙන සෑම කාර්යකදීම එම ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. එම ශිෂ්‍ය වාර්තා පොතෙහි ඇති ලියාපදිංචි අංකය විශ්වවිද්‍යාලය සම්බන්ධ වන සෑම අවස්ථාවකදීම සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. තමා ලියාපදිංචි වූ උපාධිය ලබා ගන්නා තෙක් මෙම ශිෂ්‍ය වාර්තා පොත විශ්වවිද්‍යාලය සතු වන අතර උපාධිය ලබා ගැනීමෙන් පසු ශිෂ්‍ය වාර්තා පොතේ අයිතිය අපේක්ෂකයා සතුවේ. බාහිර උපාධි අපේක්ෂකයකුගේ ලියාපදිංචිය අවලංගු කළ විට, ඔහුගේ ශිෂ්‍ය වාර්තා පොත විශ්වවිද්‍යාලයට භාර දිය යුතුය. බාහිර උපාධි අපේක්ෂක සටහන් පොත අස්ථානගත වූ විට ඒ සම්බන්ධව පොලීසියට පැමිණිල්ලක් කළ යුතු අතර, එම වාර්තා සමඟ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපක් සහ අදාළ ගෙවීම් කර අදාල වවුචරය සමඟ අතිරේක ඡායාරූපයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහි පිටපතක් ලබා ගත හැකි වේ.

09/2021 අංක දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව ඔබගේ ශිෂ්‍ය වාර්තා පොත සකස් කරනුයේ ඔබගේ උප්පැන්න සහතිකයේ ඇති නමට වන අතර උපාධි සහතිකය සකස් කරනුයේද උප්පැන්න සහතිකයේ නමට වේ. පවත්නා නීති රීති අනුව ලියාපදිංචියෙන් පසුව ඔබගේ නමෙහි යම් සංශෝධනයක් වේ නම් එය ඔබගේ උපාධි III පරීක්ෂණයට පෙර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත අවශ්‍ය නීත්‍යානුකූල ලේඛන සමඟ දැන්විය යුතු වේ. ඉහත චක්‍රලේඛයට අනුව ප්‍රතිඵල වලංගු දිනට පසුව උපාධි අපේක්ෂකයින්ගේ නමෙහි සංශෝධනය සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප වේ.

## 4.4 ලියාපදිංචි කාලසීමාව

බාහිර උපාධි පාඨමාලා සඳහා ප්‍රථමයෙන්ම අධ්‍යයන වර්ෂ තුනක කාල සීමාවකට ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. එම නියමිත කාලය තුළ උපාධි පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වන උපාධි අපේක්ෂකයකු වෙතොත් ඔහු හෝ ඇය තම ලියාපදිංචිය යාවත්කාලීන කර ගැනීම සඳහා නියමිත කාලයේදී ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. එක් වසරක් සඳහා ලියාපදිංචිය යාවත්කාලීන කිරීමේ ගාස්තුව රු.5,000/- කි. මෙලෙස ලියාපදිංචිය දීර්ඝ කිරීමේ අවස්ථා 04ක් හිමිවන අතර ලියාපදිංචිය වලංගුවන සම්පූර්ණ කාලය අධ්‍යයන වර්ෂ 07කි.

ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා වූ අයදුම්පත්, ගෙවීම් වවුචර්පත් සහ අදාල විස්තර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ **www.external.sjp.ac.lk** වෙබ් අඩවියෙහි Registration ⟶ Registration Renewel මගින් ලබා ගත හැකිය.

**අධ්‍යයන වර්ෂයක් යනු -:**

අධ්‍යයන වර්ෂයක් ලෙස අර්ථ දැක්වෙන්නේ කිසියම් පාඨමාලාවකට ලියාපදිංචි වීමේ සිට උපරිම මාස දොළහක් සම්පූර්ණ වන ලිත් වර්ෂයකි. එකී වර්ෂය ඇතුලත අදාල අවසන් පරීක්ෂණ පැවැත්විය යුතුය. කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා අදාල අධ්‍යයන වර්ෂයට නියමිත පරීක්ෂණ පවත්වා අවසන් කිරීමට නොහැකි වුවහොත් අධ්‍යයන වර්ෂයක හිමිකම උපාධි අපේක්ෂකයන්ට ලැබෙන පරිදි පහත සඳහන් ක්‍රියාකාරී නිර්වචනය භාවිතයට ගත යුතුය.

බාහිර උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වූ දින සිට උපාධි I කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ අවසන් වන දිනය දක්වා කාලය ප්‍රථම අධ්‍යයන වර්ෂය වේ. එතැන් සිට උපාධි II කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ අවසන් වන දිනය දක්වා කාලය දෙවන අධ්‍යයන වර්ෂය වේ. එතැන් සිට උපාධි III කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ අවසන් වන දිනය දක්වා කාලය තුන්වන අධ්‍යයන වර්ෂය වේ.

ප්‍රථම ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ තුනක් ඉක්ම යන තෙක් ලියා පදිංචිය වලංගු වේ. එම කාලය තුළ උපාධි I කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ තුනකටත් (03), උපාධි II කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ දෙකකටත් (02), උපාධි III කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ එකකටත් (01) ලියාපදිංචිය දීර්ඝ කර නොගෙන පෙනී සිටීමේ අයිතිවාසිකම හිමි වේ.

උක්ත සඳහන් නිර්දේශප්‍රකාරව ප්‍රථම ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ තුන ඇතුලත උපාධිය සම්පූර්ණ කිරීමට නොහැකි වන අපේක්ෂකයින් සිවුවන අධ්‍යයන වර්ෂය සඳහා තම ලියාපදිංචිය දීර්ඝ කරගත යුතුය. එලෙස අලුත් කරන ලද අධ්‍යයන වර්ෂය තුළ දී උපාධි I, II සහ III කොටස සඳහා පවත්වනු ලබන එක් පරීක්ෂණයකට බැගින් පෙනී සිටීමේ අයිතිවාසිකම හිමි වේ.

මේ ආකාරයට උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ගැනීම සඳහා ලියා පදිංචිය අලුත් කිරීමේ අවස්ථා හතරක් එක් අපේක්ෂකයකුට හිමි වේ. ඒ අනුව මුල් ලියාපදිංචි අධ්‍යයන වර්ෂ තුනද ඇතුලත්ව සමස්ත පාඨමාලාව අවසන් කිරීම සඳහා අධ්‍යයන වර්ෂ හතක් (07) සෑම අපේක්ෂකයකුටම හිමි වේ. මෙම අධ්‍යයන වර්ධ හතක (07) කාලය තුළ උපාධි I කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ හතකටත් (07), උපාධි II කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ හයකටත් (06), උපාධි III කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ පහකටත් (05) පෙනී සිටීමේ අයිතිවාසිකම හිමි වේ.

| | උපාධි කොටස | පරීක්ෂණ ගණන |
|---|---|---|
| උපරිම අධ්‍යයන වර්ෂ 07 | උපාධි I | 07 |
| | උපාධි II | 06 |
| | උපාධි III | 05 |

## 4.5 පාඨමාලා ගාස්තු

| පාඨමාලාව | ලියාපදිංචි ගාස්තු | පළමු වාරිකය | දෙවන වාරිකය | තෙවන වාරිකය |
|---|---|---|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | රු.15, 000/- | රු.40, 000/- | රු.30, 000/- | රු.30, 000/- |
| ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය | රු.15, 000/- | රු.60, 000/- | රු.60, 000/- | රු.60, 000/- |
| සාමාජීය විද්‍යාවේ දී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය | රු.15, 000/- | රු.40, 000/- | රු.30, 000/- | රු.30, 000/- |

- **පළමු වාරිකය හා ලියාපදිංචි ගාස්තු පාඨමාලාවට ලියාපදිංචි වීමේදී ගෙවීම් කළ යුතුය. දෙවන වාරික හා තෙවන වාරික ගෙවීම් පිළිබඳ විස්තර www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවිය හරහා පමණක් දැනුම් දෙනු ලැබේ.)**

## පරීක්ෂණ ගාස්තු

උපාධි I, උපාධි II හා උපාධි III පරීක්ෂණයන්ට වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතුය. ඊට අදාළ ගාස්තු හා අයදුම්පත්‍ර **www.external.sjp.ac.lk** යන අපගේ වෙබ් අඩවිය හරහා දැනුම් දෙනු ලැබේ. **උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර ඉහත සියලුම (ලියාපදිංචි හා සියලු වාරික 1,2,3) ගාස්තු ගෙවා අවසන් කර තිබීම අනිවාර්ය වේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබේ.**

1. **ප්‍රථමවරට පෙනී සිටින සිසුන් සඳහා**

| පාඨමාලාවේ නම | පළමු වසර | දෙවන වසර | තෙවන වසර |
|---|---|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | රු.8,000 | රු.10,000 | රු.12,000 |
| ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | රු.8,000 | රු.10,000 | රු.12,000 |
| සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | රු.8,000 | රු.10,000 | රු.12,000 |

**2. පුනර් අපේක්ෂකයන් සඳහා**

මෙම උපාධි පාඨමාලාවටත් අදාළ පුනර් විෂයයන් සඳහා ගෙවීම් කිරීම පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.

- ❖ එක් විෂයයක් සඳහා - රු. **5,000/-**
- ❖ විෂයයන් 02 ක් සඳහා - රු. **7,000/-**
- ❖ විෂයයන් 03 ක් සඳහා - රු. **9,000/-**
- ❖ විෂයයන් 04 ක් සඳහා - රු. **11,000/-**
- ❖ විෂයන් 5 ක් හෝ ඊට වැඩි **-** රු. **13,000/-**

- ***ලියාපදිංචිය අවලංගු කිරීම***

***ඔබ විසින් ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන ලද උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය ඇතුළු ලියකියවිලි වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේදී අසත්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බව සනාථ වුවහොත් ඔබගේ ලියාපදිංචිය අවලංගු කිරීමටත්, ඔබ විසින් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති කිසිදු මුදලක් ආපසු නොගෙවීමටත් විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරනු ලැබේ.***

උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පසු ඔබ විසින් ලියාපදිංචිය අවලංගු කරන්නේ නම් ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමඟ ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- ***ලියාපදිංචිය අවලංගු කිරීමේ දී ගාස්තු නැවත ගෙවීම***

ලියාපදිංචිය අවලංගු කිරීමේදී ලියාපදිංචි ගාස්තු (රු.15,000/-) නැවත ගෙවනු නොලැබේ. එහෙත් **ලියාපදිංචි දින සිට සති දෙකක් ඇතුළත කරනු ලබන ඉල්ලීම් සඳහා පමණක්** ගෙවන ලද **ලියාපදිංචි ගාස්තු හැර** පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන මුදල් ආපසු ගෙවනු ලබයි. **මෙම කාලසීමාවෙන් පසු පාඨමාලා ගාස්තු නැවත ගෙවන ලෙස කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

## 5. මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය යටතේ ඉදිරිපත් කරනු ලබන උපාධි පාඨමාලා

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් පහත දැක්වෙන උපාධි පාඨමාලා ඉදිරිපත් කරනු ලබයි.

(අ) ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - අධ්‍යයන වර්ෂ තුනකි.

(ආ) Bachelor of Arts in English (General) External Degree – Three year programme

(ඇ) සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව- අධ්‍යයන වර්ෂ තුනකි.

මෙම පීඨයේ පාඨමාලා ඒකක ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ.

(අ) අනිවාර්ය පාඨමාලා ඒකක

(අ) අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා ඒකක

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ලියාපදිංචි වන සෑම ශිෂ්‍යයෙකුම තම අධ්‍යයන ක්ෂේත්‍රයට/ක්ෂේත්‍රයන්ට අයත් පාඨමාලා ඒකකවලට අමතරව පළමු වර්ෂයේදී හා දෙවන වර්ෂයේදී පැවැත්වෙන එක් එක් පාඨමාලාවට අදාළ අනිවාර්ය පාඨමාලා ඒකක හැදෑරීම අත්‍යවශ්‍ය වේ.

**පාඨමාලා ඒකක ක්‍රමය**

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙහි බාහිර උපාධි පාඨමාලා සකස් කර ඇත්තේ පාඨමාලා ඒකක ක්‍රමයට අනුවය. එම පාඨමාලා ඒකක වර්ෂ පූර්ණ ඒවා වන අතර සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේදීම බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය විසින් අධ්‍යයන කාල සටහනක් ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

## පාඨමාලා ඒකක කේත

සෑම පාඨමාලා ඒකකයක්ම හැඳින්වීම සඳහා ඉංග්‍රීසි කැපිටල් අක්ෂර හතරකින් සහ ඉලක්කම් පහකින් යුතු කේතයක් භාවිත කරනු ලැබේ. කිසියම් පාඨමාලා ඒකකයක් සඳහා භාවිත කරන කේතය මගින් එම පාඨමාලා ඒකකය අයත් වන අධ්‍යයන ක්ෂේත්‍රය, අධ්‍යයන වර්ෂය, පාඨමාලා ඒකකයේ අනුක්‍රමික අංකය සහ එම පාඨමාලාවේ ඒකක අගය නිරූපණය වේ.

**STGE 1001.4 - මූලික ගණිතය**

| **STGE** | **1** | **1001.4** | **4** |
|---|---|---|---|
| අධ්‍යයන ක්ෂේත්‍රයේ කේතය | වර්ෂය | පාඨමාලා ඒකකයේ අනුක්‍රමික අංකය | ඒකක අගය |

## ඒකක අගය

පාඨමාලා ඒකකයක ඒකක අගය ශිෂ්‍ය සම්බන්ධීකරණ කාලය, ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ, අඛණ්ඩ ඇගයීම්, ප්‍රායෝගික පරීක්ෂණ, ක්ෂේත්‍ර අධ්‍යයන යනාදිය මත තීරණය කෙරේ. කිසියම් අපේක්ෂකයකු ආචාර්යවරයෙකුගේ ඍජු අධීක්ෂණය යටතේ ගත කරන අධ්‍යයන කාලය සහ ශිෂ්‍යයා විසින් ස්වයං අධ්‍යයන කටයුතු සඳහා යොදනු ලබන මූලික කාලය ද ඇතුලුව ශිෂ්‍ය සම්බන්ධීකරණ පැය ගණන අර්ථ දැක්වේ. ඒ අනුව එක් එක් පාඨමාලා ඒකක සඳහා නියමිත ශිෂ්‍ය සම්බන්ධීකරණ කාලය අදාල විෂය නිර්දේශයන්හි සවිස්තරාත්මකව දක්වා ඇත.

## 5.1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

### 5.1.1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ ව්‍යුහය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ ව්‍යුහය සැකසී ඇත්තේ පාඨමාලා ඒකක ක්‍රමයට (Course Unit System) අනුවය. ඒ අනුව අදාල විෂය ධාරාවට අයත් පාඨමාලා ඒකක 18 කින් සහ අනිවාර්ය පාඨමාලා ඒකක 8 කින් මෙය සමන්විත වේ. මෙම පාඨමාලා ඒකක වර්ෂ පූර්ණ ඒකක වන අතර ඒවාට අදාල විස්තර සවිස්තරාත්මක විෂය නිර්දේශයෙහි දක්වා තිබේ. අදාල විෂය ධාරාවට අයත් පාඨමාලා ඒකක 18 තෝරා ගැනීමේ දී 2021 ජනවාරි 15 දිනැති අංක 01/2021 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව විෂය ගොනු ක්‍රමය යටතේ විෂයයන් තෝරා ගැනීම සිදු කළ යුතුය. ඒ අනුව ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට අදාල සියලුම විෂයයන් පහත දැක්වෙන පරිදි කාණ්ඩ (ගොනු) තුනකට වර්ග කර ඇත. විෂයයන් තෝරා ගැනීම සඳහා **www.external.sjp.ac.lk/reg** යන වෙබ් අඩවියට පිවිස එහි පළ කර ඇති අයදුම්පත සම්පූර්ණ කර මාර්ගගත ක්‍රමවේද ඔස්සේ යොමු කළ යුතුය. (මේ පිළිබඳ විස්තරාත්මක සටහනක් 5.3 හි දැක්වේ)

**01 කාණ්ඩය**

**එක් විෂයක් පමණි**

- සිංහල
- සමාජ විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- මනෝවිද්‍යාව
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- ඉතිහාසය

**02 කාණ්ඩය**

**විෂයයන් එකක් හෝ දෙකක් පමණි**

- සමාජ සංඛ්‍යානය
- ආර්ථික විද්‍යාව
- පුරාවිද්‍යාව
- භූගෝල විද්‍යාව
- ජාත්‍යන්තර සම්බන්ධතා
- පාලි
- අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය

**03 කාණ්ඩය**

**එක් විෂයක් පමණි**

- මානව විද්‍යාව
- සංස්කෘත
- බෞද්ධ දර්ශනය
- සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය
- සංගීතය
- නාට්‍ය හා රංගකලාව
- නර්තනය
- දර්ශනය
- හින්දි
- බෞද්ධ ශිෂ්ටාචාරය
- ජපන්

### 5.1.2 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට අදාල පාඨමාලා ඒකක

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා අධ්‍යයනාංශ 16 ක් යටතේ විෂය ක්ෂේත්‍ර **27** කට අයත් පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.

| | අධ්‍යයනාංශය | අධ්‍යයන ක්ෂේත්‍රය | කේතය |
|---|---|---|---|
| 1. | අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති | • අපරාධ විද්‍යාව | CRGE |
| 2. | ආර්ථික විද්‍යාව | • ආර්ථික විද්‍යාව | ECGE |
| 3. | භූගෝල විද්‍යාව | • භූගෝල විද්‍යාව | GEGE |
| 4. | ඉතිහාස හා පුරාවිද්‍යාව | • ඉතිහාසය<br>• පුරාවිද්‍යාව | HIGE<br>ARGE |
| 5. | සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා | • නර්තනය<br>• නාට්‍ය හා රංග කලාව<br>• සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය<br>• සංස්කෘත<br>• හින්දි<br>• ජපන් | DAGE<br>DRGE<br>CUGE<br>SAGE<br>HNGE<br>JAGE |
| 6. | පාලි හා බෞද්ධ | • පාලි<br>• බෞද්ධ ශිෂ්ටාචාරය<br>• බෞද්ධ දර්ශනය<br>• ශ්‍රී ලාංකේය සමාජය | PAGE<br>BCGE<br>BPGE<br>SOFT |
| 7. | දර්ශනය හා මනෝවිද්‍යාව | • දර්ශනය<br>• මනෝවිද්‍යාව | PHGE<br>PSGE |
| 8. | දේශපාලන විද්‍යාව | • දේශපාලන විද්‍යාව<br>• ජාත්‍යන්තර සම්බන්ධතා | POGE<br>IRGE |
| 9. | සිංහල හා ජනසන්නිවේදනය | • සිංහල<br>• ජනසන්නිවේදන | SIGE<br>CMGE |
| 10. | සමාජ සංඛ්‍යානය | • සමාජ සංඛ්‍යානය | STGE |
| 11. | සමාජ විද්‍යාව | • සමාජ විද්‍යාව | SOGE |
| 12. | මානව විද්‍යාව | • මානව විද්‍යාව | ANGE |
| 13. | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය | • අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව | GENG |
| 14. | සංගීතය හා නිර්මාණ හා තාක්ෂණ අධ්‍යයනාංශය | • සංගීතය | MUGE |
| 15. | තොරතුරු හා සන්නිවේදන අධ්‍යනාංශය | • තොරතුරු තාක්ෂණය | GEIT |

### 5.1.3 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ අනිවාර්ය පාඨමාලා ඒකක

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන සෑම අපේක්ෂකයකුම තම අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අයත් පාඨමාලා ඒකකවලට අමතරව පළමු දෙවන හා තෙවන වසරවල පහත සඳහන් අනිවාර්ය පාඨමාලා ඒකක සමත්වීම අත්‍යවශ්‍ය වේ. දෙවන වසර සඳහා නියමිත වැඩ පාදක පුහුණුව (Work Based Training) ඒකක අගය තුනක් වන අනිවාර්ය පාඨමාලා ඒකකයකි. ශ්‍රේණි ලකුණු සාමාන්‍යය ගණනය කිරීමේ දී මෙය අදාල නොවූවත් උපාධි ප්‍රතිඵල ලේඛනයේ මෙම පාඨමාලාවට අදාලව උපයාගත් ශ්‍රේණිය සටහන් කරනු ලැබේ. විෂය නිර්දේශයේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව දෙවන වසරේ දී පැය 300 ක අවමයකට යටත්ව සම්පූර්ණ කළ යුතු ආයතනික පුහුණුවක් වන මෙම පාඨමාලා ඒකකයේ අරමුණ වන්නේ උපාධි අපේක්‍ෂකයින්ගේ සේවා නියුක්ති විභවතාව වැඩි දියුණු කිරීම සඳහා යථාතත්වමය වැඩපරිසරයක් තුළ සැළසුම් සහගත වෘත්තීය අත්දැකීම් තුළින් ප්‍රායෝගිකව වැඩ ඉගෙනීමට සැළැස්වීමයි.

| වසර | පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|---|
| පළමු වසර | GENG 1005.3 | English in use I | 3 |
| | GEIT 1001.3 | Introduction to Information and Commiunication Technology | 3 |
| | SOFT 1001.3 | ශ්‍රී ලාංකේය සමාජය | 2 |
| දෙවන වසර | GENG 1001.2 | English in use II | 3 |
| | GEIT 2005.3 | Microsoft Office for Workplace Productivity | 3 |
| | SOFT 2001.3 | නායකත්වය හා පෞරුෂ සංවර්ධනය | 2 |
| | GWBT 2002.2 | Work Based Training | 3 |
| තෙවන වසර | GENG 2001.3 | English for General Purpose | 3 |
| | GEIT 3005.3 | Data Visualizations and Management | 3 |

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සැලසුම් කර ඇත්තේ අධ්‍යයන වර්ෂ තුනකදී සම්පූර්ණ කිරීම සඳහා ය. ඒ අනුව වසර තුනක් තුළ බෙදී යන ඒකක අගය 97 ක් වන පරිදි පාඨමාලා ඒකක 27 ක් (අනිවාර්ය විෂයය ඒකක ද ඇතුළු ව) තෝරාගත යුතුය. පළමු වසර සඳහා ඒකක අගය 32 ක්, දෙවන වසර සඳහා ඒකක අගය 32 ක් සහ තෙවන වසර සඳහා ඒකක අගය 30 ක් වන පරිදි මෙම විෂය ඒකක තෝරා ගත යුතු ය.

විෂය ගොනු ක්‍රමය යටතේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා විෂයන් තෝරා ගැනීම ක්‍රමවේද දෙකක් යටතේ සිදු කළ හැකි අතර ඒ පිළිබඳව නිදර්ශනයක් පහත දක්වේ.

**ක්‍රමවේදය 01 - : විෂය කාණ්ඩ 03 න් එක් විෂය බැගින් විෂයයන් 03 ක් තෝරා ගැනීම.**

උදාහරණයක් ලෙස **පළමු කාණ්ඩයෙන් සිංහල ද , දෙවන කාණ්ඩයෙන් භූගෝල විද්‍යාව ද , තෙවන කාණ්ඩයෙන් මානව විද්‍යාව ද** තෝරා ගන්නේ නම්,

**01 කාණ්ඩය**

- **සිංහල** *
- සමාජ විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- මනෝවිද්‍යාව
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- ඉතිහාසය

**02 කාණ්ඩය**

- සමාජ සංඛ්‍යානය
- ආර්ථික විද්‍යාව
- පුරාවිද්‍යාව
- **භූගෝල විද්‍යාව** **
- ජාත්‍යන්තර සම්බන්ධතා
- පාලි
- අපරාධ විද්‍යාව

**03 කාණ්ඩය**

- **මානව විද්‍යාව** ***
- සංස්කෘත
- බෞද්ධ දර්ශනය
- සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය
- සංගීතය
- නාට්‍ය හා රංගකලාව
- නර්තනය
- දර්ශනය
- හින්දි
- බෞද්ධ ශිෂ්ටාචාරය
- ජපන්

**පොදු කාණ්ඩය**

- English in Use I
- English in Use II
- Introduction to Information & Communication Technology
- ශ්‍රී ලාංකේය සමාජය
- නායකත්වය සහ පෞරුෂ සංවර්ධනය
- English for General Purposes
- Data Visualization & Management
- Microsoft Office for Workplace Productivity

**ප්‍රථම වර්ෂය**

| විෂයය | කේතය | ඒකක අගය |
|---|---|---|
| සිංහල * | SIGE 1001.4<br>SIGE 1002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 1001.4<br>GEGE 1002.4 | 04<br>04 |
| මානව විද්‍යාව *** | ANGE 1001.4<br>ANGE 1002.4 | 04<br>04 |
| English In Use I | GENG 1005.3 | 03 |
| Introduction to Information & Communication Technology | GEIT 1001.3 | 03 |
| ශ්‍රී ලාංකේය සමාජය | SOFT 1001.2 | 02 |

**දෙවන වර්ෂය**

| විෂයය | කේතය | ඒකක අගය |
|---|---|---|
| සිංහල * | SIGE 2001.4<br>SIGE 2002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 2001.4<br>GEGE 2002.4 | 04<br>04 |
| මානව විද්‍යාව *** | ANGE 2001.4<br>ANGE 2002.4 | 04<br>04 |
| English In Use II | GENG 2005.3 | 03 |
| නායකත්වය සහ පෞරුෂ සංවර්ධනය | SOFT 2002.2 | 02 |
| Microsoft Office for Workplace Productivity | GEIT 2001.3 | 03 |

**තෙවන වර්ෂය**

| විෂයය | කේතය | ඒකක අගය |
|---|---|---|
| සිංහල * | SIGE 3001.4<br>SIGE 3002.4 | 04<br>04 |
| | | |
| භූගෝල විද්‍යාව ** | GEGE 3001.4<br>GEGE 3002.4 | 04<br>04 |
| මානව විද්‍යාව *** | ANGE 3001.4<br>ANGE 3002.4 | 04<br>04 |
| English for General Purposes | GENG 3005 | 03 |
| Data Visualization & Management | GEIT 3001 | 03 |

**ක්‍රමවේදය 02 - : 01 වන විෂය කාණ්ඩයෙන් එක් විෂයයක් හා 02 වන විෂය කාණ්ඩයෙන් විෂයයන් 02 ක් තෝරා ගැනීම.**

උදාහරණයක් ලෙස **පළමු කාණ්ඩයෙන් සිංහල ද , දෙවන කාණ්ඩයෙන් භූගෝල විද්‍යාව හා ජාත්‍යන්තර සම්බන්ධතා** තෝරා ගන්නේ නම්,

**01 කාණ්ඩය**

- **සිංහල ***
- සමාජ විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- මනෝවිද්‍යාව
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- ඉතිහාසය

**02 කාණ්ඩය**

- සමාජ සංඛ්‍යානය
- ආර්ථික විද්‍යාව
- පුරාවිද්‍යාව
- **භූගෝල විද්‍යාව****
- **ජාත්‍යන්තර සම්බන්ධතා*****
- පාලි
- අපරාධ විද්‍යාව

**03 කාණ්ඩය**

- මානව විද්‍යාව
- සංස්කෘත
- බෞද්ධ දර්ශනය
- සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය
- සංගීතය
- නාට්‍ය හා රංගකලාව
- නර්තනය
- දර්ශනය
- හින්දි
- බෞද්ධ ශිෂ්ටාචාරය
- ජපන්

**පොදු කාණ්ඩය**

- English in Use I
- English in Use II
- Introduction to Information & Communication Technology
- ශ්‍රී ලාංකේය සමාජය
- නායකත්වය සහ පෞරුෂ සංවර්ධනය
- English for General Purposes
- Data Visualization & Management
- Microsoft Office for Workplace Productivity

| ප්‍රථම වර්ෂය | | |
|---|---|---|
| **විෂයය** | **කේතය** | **ඒකක අගය** |
| සිංහල * | SIGE 1001.4<br>SIGE 1002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 1001.4<br>GEGE 1002.4 | 04<br>04 |
| ජාත්‍යන්තර සම්බන්ධතා *** | IRGE 1001.4<br>IRGE 1002.4 | 04<br>04 |
| English In Use I | GENG 1005.3 | 03 |
| Introduction to Information & Communication Technology | GEIT 1001.3 | 03 |
| ශ්‍රී ලාංකේය සමාජය | SOFT 1001.2 | 02 |

| දෙවන වර්ෂය | | |
|---|---|---|
| **විෂයය** | **කේතය** | **ඒකක අගය** |
| සිංහල * | SIGE 2001.4<br>SIGE 2002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 2001.4<br>GEGE 2002.4 | 04<br>04 |
| ජාත්‍යන්තර සම්බන්ධතා *** | IRGE 2001.4<br>IRGE 2002.4 | 04<br>04 |
| English In Use II | GENG 2005.3 | 03 |
| Microsoft Office for Workplace Productivity | GEIT 2001.3 | 03 |
| නායකත්වය සහ පෞරුෂ සංවර්ධනය | SOFT 2002.2 | 02 |

| තෙවන වර්ෂය | | |
|---|---|---|
| **විෂයය** | **කේතය** | **ඒකක අගය** |
| සිංහල * | SIGE 3001.4<br>SIGE 3002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 3001.4<br>GEGE 3002.4 | 04<br>04 |
| ජාත්‍යන්තර සම්බන්ධතා *** | IRGE 3001.4<br>IRGE 3002.4 | 04<br>04 |
| English for General Purposes | GENG 3005 | 03 |
| Data Visualization & Management | GEIT 3001 | 03 |

### 5.1.4 අධ්‍යයනාංශ මඟින් ඉදිරිපත් කරනු ලබන පාඨමාලා ඒකක

### (1) අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | පළමු වසර | |
| CRGE 1001.4 | අපරාධ විද්‍යාවේ මූලික සංකල්ප | 04 |
| CRGE 1002.4 | අපරාධ යුක්ති ක්‍රමය | 04 |
| | දෙවන වසර | |
| CRGE 2001.4 | අපරාධ විද්‍යා පර්යේෂණ මූලධර්ම | 04 |
| CRGE 2002.4 | අපරාධ විද්‍යා න්‍යායන් | 04 |
| | තෙවන වසර | |
| CRGE 3001.4 | සමකාලීන අපරාධ ප්‍රවණතා | 04 |
| CRGE 3002.4 | අපරාධ පාලනය හා නිවාරණය | 04 |

### (2) ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | පළමු වසර | |
| ECGE 1001.4 | සූක්ෂම ආර්ථික විද්‍යා මූලධර්ම | 04 |
| ECGE 1002.4 | සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම | 04 |
| | දෙවන වසර | |
| ECGE 2001.4 | අන්තර්මධ්‍ය සූක්ෂම ආර්ථිකවිද්‍යාව | 04 |
| ECGE 2002.4 | අන්තර්මධ්‍ය සාර්ව ආර්ථික විද්‍යාව | 04 |
| | තෙවන වසර | |
| ECGE 3001.4 | තත්කාලීන ආර්ථික ගැටලු | 04 |
| ECGE 3002.4 | රාජ්‍ය ආර්ථික විද්‍යාව | 04 |

## (3) භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| GEGE 1001.4 | භූගෝල විද්‍යා චින්තනය හා ක්‍රමවේදය | 04 |
| GEGE 1002.4 | භෞතික හා මානව භූගෝල විද්‍යාව | 04 |
| **දෙවන වසර** | | |
| GEGE 2001.4 | සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප | 04 |
| GEGE 2002.4 | භෞතික පරිසරය හා පරිසර කළමනාකරණය | 04 |
| **තෙවන වසර** | | |
| GEGE 3001.4 | සංවර්ධනය හා සැලසුම්කරණය | 04 |
| GEGE 3002.4 | තුලනාත්මක ප්‍රාදේශීය අධ්‍යයනය | 04 |

## (4) ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය

### (i) ඉතිහාසය විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| HIGE 1001.4 | පෙරදිග ඉතිහාසයේ බලවේග | 04 |
| HIGE 1002.4 | අපරදිග ඉතිහාසයේ බලවේග | 04 |
| **දෙවන වසර** | | |
| HIGE 2001.4 | ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව. 1500 දක්වා) | 04 |
| HIGE 2002.4 | ඉන්දියා ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව.1200 දක්වා) | 04 |
| **තෙවන වසර** | | |
| HIGE 3001.4 | ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය (ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1948 දක්වා) | 04 |
| HIGE 3002.4 | යුරෝපා ඉතිහාසය (16 වැනි සියවසේ සිට 20 වැනි සියවස දක්වා) | 04 |

### (ii) පුරාවිද්‍යාව විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| ARGE 1001.4 | ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ඉතිහාසය | 04 |
| ARGE 1002.4 | සම්භාව්‍ය චිත්‍ර හා මූර්ති | 04 |
| | **දෙවන වසර** | |
| ARGE 2001.4 | පුරාවිද්‍යාවේ මූලධර්ම හා ක්ෂේත්‍ර පුරාවිද්‍යාව | 04 |
| ARGE 2002.4 | අභිලේඛන හා අක්ෂර රූප විද්‍යාව | 04 |
| | **තෙවන වසර** | |
| ARGE 3001.4 | සම්භාව්‍ය වාස්තු විද්‍යාව හා නාණක විද්‍යාව | 04 |
| ARGE 3002.4 | ස්මාරක සංරක්ෂණය සහ පුරාවිද්‍යා උරුම කළමනාකරණය | 04 |

## (6) සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණ අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| | **පළමු වසර** | | |
| MUGE 1001.4 | උත්තර භාරතීය සංගීතය ප්‍රායෝගික I (ගායනය) | 04 | **නිපුණතා පරීක්ෂණයෙන් සමත්** |
| MUGE 1002.4 | හින්දුස්ථානී සංගීතය ප්‍රායෝගික I (වාදනය) | 04 | **නිපුණතා පරීක්ෂණයෙන් සමත්** |
| MUGE 1003.4 | හින්දුස්ථානී සංගීතය ප්‍රායෝගික I (තබ්ලා) | 04 | **නිපුණතා පරීක්ෂණයෙන් සමත්** |
| MUGE 1004.4 | භාරතීය සංගීත සිද්ධාන්ත හා ඉතිහාසය (ගායනය/වාදනය) | 04 | *MUGE 1001.4 හෝ MUGE 1003.4* |
| MUGE 1005.4 | භාරතීය සංගීත සිද්ධාන්ත හා ඉතිහාසය (තබ්ලා) | 04 | *MUGE 1004.4* |

| | | | |
|---|---|---|---|
| **දෙවන වසර** | | | |
| MUGE 2001.4 | හින්දුස්ථානි සංගීතය ප්‍රායෝගික II (ගායනය) | **04** | *MUGE 1001.4* |
| MUGE 2002.4 | හින්දුස්ථානි සංගීතය ප්‍රායෝගික II (වාදනය) | **04** | *MUGE 1003.4* |
| MUGE 2003.4 | හින්දුස්ථානි සංගීතය ප්‍රායෝගික II (තබ්ලා) | **04** | *MUGE 1004.4* |
| MUGE 2004.4 | අපරදිග සංගීත සිද්ධාන්ත | **04** | *MUGE 1001.4 හෝ 1003.4 හෝ 1004.4 හෝ 1005.4* |
| **තෙවන වසර** | | | |
| MUGE 3001.4 | හින්දුස්ථානි සංගීතය ප්‍රායෝගික III (ගායනය) | **04** | *MUGE 2001.4* |
| MUGE 3003.4 | හින්දුස්ථානි සංගීතය ප්‍රායෝගික III (වාදනය) | **04** | *MUGE 2003.4* |
| MUGE 3004.4 | හින්දුස්ථානි සංගීතය ප්‍රායෝගික III (තබ්ලා) | **04** | *MUGE 2004.4* |
| MUGE 3002.4 | රබීන්ද්‍ර සංගීතය හා දේශීය ජන සංගීතය | **04** | *MUGE 3001.4 හෝ 3003.4* |
| MUGE 3005.4 | ශ්‍රී ලාංකේය අවනද්ධ වාද්‍ය භාණ්ඩ (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | **04** | *MUGE 3004.4* |

## (7) <u>භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය</u>

### (i) නර්තනය විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| **පළමු වසර** | | | නිපුණතා පරීක්ෂණයෙන් සමත් වීම (අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන ලිඛිත / ප්‍රායෝගික පරීක්ෂණයකින් හෝ අධ්‍යයනාංශය විසින් තීරණය කරනු ලබන නිර්ණායකයන්ට අනුව තෝරා ගැනීම සිදු කෙරේ) |
| DAGE 1001.4 | දේශීය නර්තන ඉතිහාසය හා සිද්ධාන්ත | 04 | |
| DAGE 1002.4 | දේශීය නර්තන ප්‍රායෝගික I (උඩරට/ පහතරට/ සබරගමු) | 04 | |
| **දෙවන වසර** | | | |
| DAGE 2001.4 | භාරතීය නර්තන ඉතිහාසය හා සිද්ධාන්ත | 04 | |
| DAGE 2002.4 | නර්තන ප්‍රායෝගික II (උඩරට/පහතරට ) | 04 | DAGE 1002.4 |
| **තෙවන වසර** | | | |
| DAGE 3001.4 | ලෝක නර්තන සම්ප්‍රදායන් | 04 | |
| DAGE 3002.4 | නර්තන ප්‍රායෝගික III (උඩරට/ පහතරට/ සබරගමු ) | 04 | DAGE 2002.4 |

## (ii) නාට්‍ය හා රංග කලාව විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| DRGE 1001.4 | නාට්‍ය ප්‍රවේශය සහ ලෝකයේ පැරණි නාට්‍ය කලාව | 04 |
| DRGE 1002.4 | ශ්‍රී ලාංකේය නාට්‍ය කලාව | 04 |
| | **දෙවන වසර** | |
| DRGE 2001.4 | යුරෝපීය නාට්‍ය කලාව | 04 |
| DRGE 2002.4 | ශ්‍රී ලාංකේය නූතන නාට්‍ය කලාව | 04 |
| | **තෙවන වසර** | |
| DRGE 3001.4 | නාට්‍ය නිර්මාණකරණය හා රංගභූමි ශිල්පය | 04 |
| DRGE 3002.4 | නාට්‍ය රචනය හා විචාරය | 04 |

## (iii) සංස්කෘත විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| SAGE 1001.4 | සංස්කෘත සාහිත්‍යය හා තදීය ඉතිහාසය | 04 |
| SAGE 1002.4 | සංස්කෘත ව්‍යාකරණය | 04 |
| | **දෙවන වසර** | |
| SAGE 2001.4 | සම්භාව්‍ය සංස්කෘත සාහිත්‍යය හා සංස්කෘත භාෂා අධ්‍යයනය | 04 |
| SAGE 2002.4 | සංස්කෘත නාට්‍ය සාහිත්‍යය | 04 |
| | **තෙවන වසර** | |
| SAGE 3001.4 | වෛදික හා බෞද්ධ සංස්කෘත සාහිත්‍යය | 04 |
| SAGE 3002.4 | සංස්කෘත කාව්‍ය විචාරවාද හා භාෂා අධ්‍යයනය | 04 |

## (iv) හින්දි විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | කේතය |
|---|---|---|---|
| පළමු වසර | | | |
| HNGE 1001.4 | මූලික හින්දි ව්‍යාකරණ | 04 | නැත |
| HNGE 1002.4 | හින්දි සාහිත්‍ය ඉතිහාසය | 04 | නැත |
| දෙවන වසර | | | |
| HNGE 2001.4 | හින්දි ව්‍යාකරණ හා නිබන්ධ ලේඛනය | 04 | HNGE 1001.4 |
| HNGE 2002.4 | හින්දි ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය | 04 | HNGE 1001.4, 1002.4 |
| තෙවන වසර | | | |
| HNGE 3001.4 | හින්දි ඉතිහාසය හා පරිවර්තන කලාව | 04 | HNGE 1001.4, 1002.4, 2001.4, 2002.4 |
| HNGE 3002.4 | හින්දි ජන සාහිත්‍යය හා උත්තර භාරතීය සංස්කෘතිය | 04 | HNGE 1002.4, 2002.4 |

## (v) සංස්කෘතික අධ්‍යයනය විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| පළමු වසර | | |
| CUGE 1003.4 | සංස්කෘතික අධ්‍යයන ප්‍රවේශය | 04 |
| CUGE 1004.4 | සෞන්දර්ය අධ්‍යයන ප්‍රවේශය | 04 |
| දෙවන වසර | | |
| CUGE 2002.4 | ලෝක ආගම් හා සංස්කෘති | 04 |
| CUGE 2003.4 | භාෂාව, සංස්කෘතිය හා සෞන්දර්යය | 04 |
| තෙවන වසර | | |
| CUGE 3001.4 | ශ්‍රී ලාංකේය ජන සම්ප්‍රදාය | 04 |
| CUGE 3002.4 | ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය | 04 |

### (vi) ජපන් විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| පළමු වසර | | | |
| JAGE 1001.4 | Introduction to Japanese Language | 04 | නැත |
| JAGE 1002.4 | Japanese Language and Culture | 04 | JAGE 1001.4 |
| දෙවන වසර | | | |
| JAGE 2001.4 | Communicative Japanese | 04 | JAGE 1002.4 |
| JAGE 2002.4 | Japanese Language and Lifestyle | 04 | JAGE 2001.4 |
| තෙවන වසර | | | |
| JAGE 3001.4 | Japanese For Business | 04 | JAGE 2002.4 |
| JAGE 3002.4 | Advanced Japanese Language Skills | 04 | JAGE 3001.4 |

## (8) පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

### (i) පාලි විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| පළමු වසර | | |
| PAGE 1001.4 | පාලි භාෂා ප්‍රවේශය | 04 |
| PAGE 1002.4 | පාලි සාහිත්‍ය ප්‍රවේශය | 04 |
| දෙවන වසර | | |
| PAGE 2001.4 | පාලි සාහිත්‍ය ඉතිහාසය | 04 |
| PAGE 2002.4 | නිර්දිෂ්ට ග්‍රන්ථ | 04 |
| තෙවන වසර | | |
| PAGE 3001.4 | ව්‍යාකරණ හා වාග් විද්‍යාව | 04 |
| PAGE 3002.4 | අනිර්දිෂ්ට ග්‍රන්ථ හා ධර්ම විනය | 04 |

## (ii) බෞද්ධ ශිෂ්ටාචාරය විෂයයට පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| BCGE 1001.4 | භාරතීය බෞද්ධ ශිෂ්ටාචාරයෙහි ප්‍රභවය සහ පරිහානිය | 04 |
| BCGE 1002.4 | මූලධර්ම අධ්‍යයනය | 04 |
| | **දෙවන වසර** | |
| BCGE 2001.4 | ශ්‍රී ලංකාවේ බෞද්ධ ශිෂ්ටාචාරය | 04 |
| BCGE 2002.4 | බෞද්ධ සමාජ හා දර්ශනය | 04 |
| | **තෙවන වසර** | |
| BCGE 3001.4 | බෞද්ධ සංස්ථා අධ්‍යයනය | 04 |
| BCGE 3002.4 | බෞද්ධ සාහිත්‍යය හා කලා ශිල්ප | 04 |

## (iii) බෞද්ධ දර්ශනය විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| BPGE 1001.4 | බෞද්ධ දර්ශනය අධ්‍යයන ප්‍රවේශය | 04 |
| BPGE 1002.4 | ආදී බෞද්ධ දර්ශනය | 04 |
| | **දෙවන වසර** | |
| BPGE 2001.4 | බෞද්ධ දර්ශනයේ ඥාන විභාගය | 04 |
| BPGE 2002.4 | බෞද්ධ දර්ශන ඉතිහාසය | 04 |
| | **තෙවන වසර** | |
| BPGE 3001.4 | බෞද්ධ මනෝවිද්‍යාව හා ආචාර විද්‍යාව | 04 |
| BPGE 3002.4 | බුදු සමය හා සමාජ ගැටලු | 04 |

## (9) දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය

### (i) දර්ශනය විෂයයට පා ඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| PHGE 1001.4 | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | 04 |
| PHGE 1002.4 | දාර්ශනික ගැටලු | 04 |
| | **දෙවන වසර** | |
| PHGE 2001.4 | බටහිර දර්ශනය | 04 |
| PHGE 2002.4 | භාරතීය දර්ශනය | 04 |
| | **තෙවන වසර** | |
| PHGE 3001.4 | සාමාන්‍ය මනෝවිද්‍යාව | 04 |
| PHGE 3002.4 | ආචාර විද්‍යාව හා සමකාලීන ගැටලු | 04 |

### (ii) මනෝ විද්‍යාව විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| PSGE 1001.4 | සාමාන්‍ය මනෝ විද්‍යාව | 04 |
| PSGE 1002.4 | ව්‍යවහාරික මනෝ විද්‍යාව | 04 |
| | **දෙවන වසර** | |
| PSGE 2001.4 | පෞරුෂය පිළිබඳ මනෝ විද්‍යාව | 04 |
| PSGE 2002.4 | මිනිස් හැසිරීමේ ස්වභාවය | 04 |
| | **තෙවන වසර** | |
| PSGE 3001.4 | ප්‍රජානන මනෝ විද්‍යාව | 04 |
| PSGE 3002.4 | කාර්මික මනෝ විද්‍යාව | 04 |

## (10) දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය

### (i) දේශපාලන විද්‍යාව විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| POGE 1001.4 | දේශපාලන විද්‍යාවේ මූලිකාංග | 04 |
| POGE 1002.4 | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමය සහ දේශපාලන වෙනස්වීම් | 04 |
| | **දෙවන වසර** | |
| POGE 2001.4 | දේශපාලන න්‍යාය | 04 |
| POGE 2002.4 | තුලනාත්මක දේශපාලනය හා ආණ්ඩුක්‍රමය | 04 |
| | **තෙවන වසර** | |
| POGE 3001.4 | දේශපාලන සමාජ විද්‍යාව | 04 |
| POGE 3002.4 | රාජ්‍ය පරිපාලනය | 04 |

### (ii) ජාත්‍යන්තර සම්බන්ධතා විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| IRGE 1001.4 | ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ හැඳින්වීමක් | 04 |
| IRGE 1002.4 | ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන | 04 |
| | **දෙවන වසර** | |
| IRGE 2001.4 | ජාත්‍යන්තර දේශපාලනය | 04 |
| HIGE 2002.4 | ගැටුම් සහ ගැටුම් නිරාකරණය | 04 |
| | **තෙවන වසර** | |
| IRGE 3001.4 | ලෝක දේශපාලනයේ සමකාලීන ගැටලු | 04 |
| IRGE 3002.4 | ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය | 04 |

## (11) සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය

### (i) සිංහල විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| SIGE 1001.4 | සාහිත්‍ය ප්‍රවේශය | 04 |
| SIGE 1002.4 | භාෂා ප්‍රවේශය | 04 |
| | **දෙවන වසර** | |
| SIGE 2001.4 | සිංහල භාෂාවේ ඉතිහාසය හා ව්‍යාකරණ සම්ප්‍රදාය | 04 |
| SIGE 2002.4 | සිංහල ප්‍රබන්ධ සාහිත්‍යය | 04 |
| | **තෙවන වසර** | |
| SIGE 3001.4 | සම්භාව්‍ය සිංහල සාහිත්‍ය | 04 |
| SIGE 3002.4 | සිංහල සංස්කෘතිය | 04 |

### (ii) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| | **පළමු වසර** | | අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා ජනසන්නිවේදනය විෂයය හදාරා තිබිය යුතුය |
| CMGE 1001.4 | සන්නිවේදන මූලධර්ම | 04 | |
| CMGE 1002.4 | මාධ්‍ය අධ්‍යයනය හැඳින්වීම | 04 | |
| | **දෙවන වසර** | | |
| CMGE 2001.4 | භාවිත සන්නිවේදනය | 04 | |
| CMGE 2002.4 | ජනමාධ්‍ය භාවිතය | 04 | |
| | **තෙවන වසර** | | |
| CMGE 3001.4 | වෘත්තීය සන්නිවේදන | 04 | |
| CMGE 3002.4 | ජනමාධ්‍ය හා සමාජය | 04 | |

## (12) සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| පළමු වසර | | | |
| STGE 1001.4 | මූලික ගණිතය | 04 | නැත |
| STGE 1002.4 | මූලික සංඛ්‍යානය | 04 | නැත |
| දෙවන වසර | | | |
| STGE 2001.4 | සමාජීය විද්‍යාවන් සඳහා ගණිතය | 04 | STGE 2001.4 |
| STGE 2002.4 | සම්භාවිතා ව්‍යාප්ති සහ සංඛ්‍යාන අනුමිතිය | 04 | STGE 2002.4 |
| තෙවන වසර | | | |
| STGE 3001.4 | සමාජීය විද්‍යාවන් සඳහා සංඛ්‍යාන ක්‍රම | 04 | STGE 3001.4 |
| STGE 3002.4 | ප්‍රායෝගික සංඛ්‍යානය | 04 | STGE 3002.4 |

## (13) සමාජ විද්‍යා අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| පළමු වසර | | |
| SOGE 1001.4 | සමාජ විද්‍යා මූලික සංකල්ප | 04 |
| SOGE 1002.4 | සමකාලීන සමාජය හා සමාජ වෙනස්වීම | 04 |
| දෙවන වසර | | |
| SOGE 2001.4 | සමාජ විද්‍යා න්‍යාය | 04 |
| SOGE 2002.4 | ව්‍යවහාරික සමාජ විද්‍යාව | 04 |
| තෙවන වසර | | |
| SOGE 3001.4 | සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම | 04 |
| SOGE 3002.4 | ප්‍රජා සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාව | 04 |

## (14) මානව විද්‍යා අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| ANGE 1001.4 | සංස්කෘතික මානව විද්‍යාව හැඳින්වීම | 04 |
| ANGE 1002.4 | භෞතික මානව විද්‍යාව හැඳින්වීම | 04 |
| | **දෙවන වසර** | |
| ANGE 2001.4 | මානව විද්‍යා න්‍යාය | 04 |
| ANGE 2002.4 | ජනශ්‍රැති අධ්‍යයනය හා අස්පර්ශනීය සංස්කෘතික උරුමය | 04 |
| | **තෙවන වසර** | |
| ANGE 3001.4 | මානව විද්‍යාව පර්යේෂණ ක්‍රම | 04 |
| ANGE 3002.4 | ව්‍යවහාරික මානව විද්‍යාව සහ සංවර්ධනය | 04 |

## 5.2 Bachelor of Arts in English (General) External Degree

### Introduction

The External (General) Degree Program in English conducted by the Department of English and Linguistics under the Faculty of Humanities and Social Sciences consists of three core subjects, namely English Literature, English Language, and English Language Teaching Methodology. The programme is introduced with the intention of making a substantial contribution to national development by empowering the teachers of English with the necessary pedagogical knowledge and skills, by increasing the employability of the Sri Lankan graduates, and by making the students sufficiently qualified in English to take up challenges in an educational/professional setting.

### 5.2.1 The Graduate Profile

The program aims at producing a graduate,

1) Who is able to apply pedagogic knowledge and training to teach English language and English literature competently.
2) Who is capable of making a substantial contribution to the theory and practice of ELT in terms of research, innovation, and critique.
3) Who possesses the ability to critically and independently respond to any work of literature and to disseminate literary knowledge.
4) Who can examine language from structural, historical, social, and psychological perspectives and use such knowledge in drawing insights about language and apply such knowledge in relevant contexts.
5) Who is sufficiently motivated to engage in life-long learning

### 5.2.2 Target Students

1. Teachers of English in government schools, pirivenas and private schools.
2. Those who hope to pursue a career in teaching.
3. Those who hope to study English Literature and Language in a local or foreign University.

### 5.2.3 Objectives

The main objectives in introducing this degree program are as follows:

1. To provide an educational qualification for those who are currently engaged in teaching English at different levels.
2. To improve the academic and professional standards of those who are currently engaged in the field of teaching.
3. To fill the gap that exists between the supply and the demand for high quality graduates in Sri Lanka in line with the government policy on higher education.

### 5.2.4 Entry Qualifications

**Entry Requirement**:
Selection Test or any other method decided by the Department of English and Linguistics of the University of Sri Jayewardenepura .

**Intake**:
Between 500-600 students.

***Eligibility to apply for selection test:***

- Those who have obtained a minimum of three 'S' passes for any three subjects of the G.C.E. Advanced Level Examination administered by the Department of Examinations of Sri Lanka, in or after 2000

OR

- Those who have obtained a minimum of four 'S' passes for any four subjects of the G.C.E. Advanced Level Examination administered by the Department of Examinations of Sri Lanka, before 2000

OR

- Those who have obtained the Certificate of Teacher Training or Diploma in Teaching from a National College of Education (of the National Institute of Education, Ministry of Education, Sri Lanka), with a minimum of 4 Credit passes for the following subjects: Linguistics and Introduction to Phonology, English Language, English Language Teaching Methodology and English Literature

OR

- Those who have obtained a minimum of three passes for any three subjects of the General Certificate of Education Advanced Level Certificate (G.C.E. Advanced Level) of the UK Examination Boards (commonly known as London Advanced Level Examinations: Cambridge/Edexcel)

OR

- Those who have obtained a Higher Diploma in English equivalent to the SLQF Level 4 of the Sri Lanka Qualifications Framework of the University Grants Commission, Sri Lanka, on the recommendation from the Department of English and Linguistics, followed by the Senate approval of the University of Sri Jayewardenepura.

**Selection Test Conducted by the Department of English & Linguistics**

- It is mandatory for all prospective applicants to pass the Selection Test or any other method decided by the Department of English and Linguistics of the University of Sri Jayewardenepura in the event that the number of applicants exceeds the expected number except for those who have obtained a minimum of an 'S' pass for English (subject number 73) from the G. C. E. Advanced Level Examination administered by the Department of Examinations of Sri Lanka.

## 5.2.5 The Programme

This is a three-year undergraduate programme that consists of year-based courses with annual (year-end) examinations and continuous assessments[1]. This programme includes a credit system which correlates with the number of hours the students engage in active learning. The degrees are awarded after the successful completion of the entire three-year programme subject to all the laws and by-laws of the University.

[1] To be decided by the Department of English and Linguistics

### 5.2.6 The Programme Structure:

The Department offers three main subjects/study fields. These three main subjects carry a total value of 90 credits with an equal distribution within the three academic years (30 credits per year x 3 years). Each main subject consists of two course units (two papers). In addition, one compulsory course (non-credit) will be also offered by the Department in the first year, and this will be Classical Literature. This will consist of one paper and carries two credits, but will not spread over three years. Three other compulsory courses are offered by the Faculty of Humanities and Social Sciences: (1) Introduction to Information Technology, (2) Sri Lankan Society and, (3) Leadership and Personality Development. Each course carries two credits. Introduction to Information Technology is offered in the first year and the other two courses are offered in the second year. The students who are selected for the Bachelor of Arts in English degree programme should enroll for all the above courses.

If a student from any other external degree programme wishes to take some course units from the courses offered for the external degree programme in English, provision is made for such students to select English language courses coming under the course code ELAN. **However, they too should get through the selection test conducted by the Department. A separate selection test will be held for such students.**

### 5.2.7 Volume of Learning

- The volume of learning at each level is described in terms of **credits**.
- In the SLQF[2] credit system, the student workload of a study program is defined as 1500 **notional learning hours** per academic year.
- The notional learning hours include direct contact hours with teachers and trainers, time spent in self-learning, preparation for assignments, carrying out assignments and assessments. The need to undertake any or all of these will be considered when a credit is being allocated to a course unit or a module, when the syllabus is designed. It is understood that the combination of learning activities may vary from one course unit or module to another.
- The minimum number of credits per course unit or module is 1. The number of credits per course unit or module should be indicated by whole numbers.

[2] Sri Lanka Qualifications Frame work 2015

- One credit is considered equivalent to 50 notional learning hours for a taught course, laboratory studies course or field studies/clinical work. (In case of industrial training, including time allocated for assessments and in case of research, including time allocated for literature survey, one credit is considered equivalent to a minimum of 100 notional hours).

### 5.2.8 Course Structure

| Main Subject | Course Code | Course Title | Offering Dept. | Credit Value | Notional Hours | Actual Teaching Hours |
|---|---|---|---|---|---|---|
| (Year 1) English Literature | ELIT 1001 | Introduction to English Literature | Dept. of English | 05 | 250 | 40 |
| | ELIT 1002 | Augustan & Romantic Literature | Dept. of English | 05 | 250 | 40 |
| English Language | ELAN 1001 | Critical Reading & Writing | Dept. of English | 05 | 250 | 40 |
| | ELAN 1002 | Understanding English Grammar | Dept. of English | 05 | 250 | 40 |
| English Language Teaching Methodology | ELTM 1001 | Introduction to ELT | Dept. of English | 05 | 250 | 40 |
| | ELTM 1002 | Approaches & Methods in Second Language Teaching | Dept. of English | 05 | 250 | 40 |
| Classical Literature | CLIT 1005 | Introduction to Classical Literature | Dept. of English | 02 | 100 | 08 |
| Compulsory Subject | SOSE 1006 | Introduction to Information Technology | Dept. of Social Statistics | 02 | 100 | 08 |
| **Total** | | | | **34** | 1700 | 256 |
| [redacted] | | | | | | |

| Main Subject | Course Code | Course Title | Offering Dept. | Credit Value | Notional Hours | Actual Teaching Hours |
|---|---|---|---|---|---|---|
| (Year 2) English Literature | ELIT:2001 | Victorian Literature | Dept. of English | 05 | 250 | 40 |
| | ELIT:2002 | Literature from the Medieval to the Metaphysical | Dept. of English | 05 | 250 | 40 |
| English Language | ELAN:2001 | English for Employment | Dept. of English | 05 | 250 | 40 |
| | ELAN:2002 | Linguistics 1: Phonetics/phonology, morphology, and syntax | Dept. of English | 05 | 250 | 40 |
| English Language Teaching Methodology | ELTM:2001 | Teaching Language Skills | Dept. of English | 05 | 250 | 40 |
| | ELTM:2002 | Pedagogical applications | Dept. of English | 05 | 250 | 40 |
| Compulsory Subject | SOFT 2001 | Sri Lankan Society | Faculty of Humanities and SS | 02 | 100 | 08 |
| Compulsory Subject | SOFT 2002 | Leadership and Personality Development | Faculty of Humanities and SS | 02 | 100 | 08 |
| Total | | | | 34 | 1700 | 256 |

| **Main Subject** | **Course Code** | **Course Title** | **Offering Dept.** | **Credit Value** | **Notional Hours** | **Actual Teaching Hours** |
|---|---|---|---|---|---|---|
| (Year 3)<br>English Literature | ELIT 3001 | Modern and Postmodern Fiction | Dept. of English | 05 | 250 | 40 |
| | ELIT 3002 | Postcolonial & Sri Lankan Literature | Dept. of English | 05 | 250 | 40 |
| English Language | ELAN 3001 | Linguistics 2: Sociolinguistics, Psycholinguistics, Historical linguistics | Dept. of English | 05 | 250 | 40 |
| | ELAN 3002 | Discourse Analysis | Dept. of English | 05 | 250 | 40 |
| English Language Teaching Methodology | ELTM 3001 | Testing & Assessment | Dept. of English | 05 | 250 | 40 |
| | ELTM 3002 | Materials Development for ELT. | Dept. of English | 05 | 250 | 40 |
| Total | | | | **30** | 1500 | 240 |
| [redacted] | | | | | | |

## 5.3 සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

## Bachelor of Social Sciences (General) External Degree in Environmental and Development Studies

### හැඳින්වීම

පාරිසරික හා සංවර්ධන අධ්‍යයන පිළිබඳ සමාජීය විද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව මූලික වශයෙන් සංවර්ධනය වන ශ්‍රී ලංකාවේ මානව සම්පත් ප්‍රවර්ධනය අරමුණු කර ගත් එකකි. පරිසරය හා සංවර්ධනය වත්මන් ධරණීය සංවර්ධන ක්‍රියාදාමයේ තීරණාත්මක සාධක වී ඇති බැවින් දැනුම මුල්කරගත් සමාජ ආර්ථික ක්‍රමය තුළ එයට සුවිශේෂ ස්ථානයක් හිමි වෙයි. පශ්චාද් යුද සමය තුළ ශීඝ්‍ර සංවර්ධන ක්‍රියාදාමයකට අවතීර්ණ වී සිටින ශ්‍රී ලංකාවට වර්තමානයේ වඩාත් ප්‍රශස්ත ලෙස මානව සම්පත් භාවිතයට ගැනීම උදෙසා නව ක්‍රමෝපායන් සෙවීමට සිදුවී තිබේ. මෙම පසුබිම තුළ පරිසරය හා සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක දැනුම ඵලදායී ලෙස භාවිතයට ගත හැකි කුසලතාවෙන් සපිරි උපාධිධරයන් බිහිකිරීමේ කාලීන අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් මෙම නව බාහිර උපාධි පාඨමාලාව ඉදිරිපත් කරනු ඇත.

ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයකින් හඳුන්වා දෙනු ලබන සංවර්ධනය හා පරිසරය පිළිබඳ එකම බාහිර උපාධි පාඨමාලාව වන මෙය සංවර්ධනය සඳහා වඩාත් ඵලදායී ලෙස මානව සම්පත යොදා ගැනීමේ දිගුකාලීන අරමුණ ඉලක්ක කර ගනිමින් සකසා තිබේ. සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ විවිධ අංශයන්හි දිගුකාලීන සේවා පලපුරුද්ද ඇති වෘත්තිකයන් හට ද මෙම පාඨමාලාව හැදෑරීමේ අවකාශ සලසා ඇත්තේ උක්ත අරමුණ සාක්ෂාත් කරගනු පිණිසය. වඩාත් කාර්යක්ෂම වූ ඵලදායි සංවර්ධන ක්‍රියාවලියක නියමුවන් වශයෙන් ක්‍රියාකාරී මානව සම්පත් සංවර්ධනය කිරීම මෙම පාඨමාලාවේ ජාතික අභිලාෂය වේ. සංවර්ධනය සහ පරිසරය පිළිබඳ මූලික අවබෝධය ලබා දෙමින් විවිධ ක්ෂේත්‍රයන් තුළ එම දැනුම භාවිතයට ගැනීමේ හැකියාව ප්‍රගුණ කරවීමත් සංවර්ධන සැලසුම්කරණයේ දී හා ක්‍රියාවට නැංවීමේ දී ප්‍රාදේශීය සංවර්ධනය හා පාරිසරික තිරසර බව යන අංශ දෙකම සමෝධානය කිරීමට හැකි උපාධිධරයන් බිහිකිරීමත් මෙම පාඨමාලාවේ අපේක්ෂිත ඵලය වෙයි. ශිෂ්‍ය ප්‍රජාවගේ මෙන් ම පුළුල් සමාජයේ ද යහපත උදෙසා අතිශය යෝග්‍ය වූ ශිල්ප ක්‍රම ඔස්සේ න්‍යායාත්මක සහ ව්‍යවහාරික ඥාන විතරණය සඳහා කැපවීමත්, නිර්මාණශීලී හා බුද්ධිමය පදනමකින් යුක්ත නව මත ඉදිරිපත් කිරීමේ නිදහසකින් යුත් සම අවස්ථා සහ අධ්‍යාපනික දියුණුවක් ඇතිකරන පරිසරයක් තුළ ඉගැන්වීමත්, ඥාන ගවේෂණය සහ පර්යේෂණ මගින් අවකාශීය අධ්‍යයනයේ නියුතු විශිෂ්ටත්වයේ කේන්ද්‍රය ලෙස වර්ධනය වීමත්, සිය මෙහෙවර වශයෙන් සලකන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් මෙම පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ.

පරිසරය හා සංවර්ධනය සම්බන්ධ විෂයක්ෂේත්‍ර රැසකින් මෙහි පාඨමාලා ව්‍යුහය සැකසී තිබේ. මිනිස් සමාජය සහ භෞතික ලෝකය අතර පවත්නා සංකීර්ණ වූත් එකිනෙකට බැඳුණු හා පරස්පර වූත් සම්බන්ධතා සාර්ව ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීමත්, සංවර්ධන ක්‍රියාවලියේ ගතිකත්වය හඳුනාගනිමින් න්‍යායාත්මක දැනුමත් ප්‍රායෝගික වශයෙන් භාවිතයට ගැනීම අරමුණු කරගත් පුළුල් විෂය පථයක් මෙම පාඨමාලාවට අයත් වේ.

ප්‍රථම වසර සඳහා පරිසරය හා සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක දැනුම ලබාදීම අරමුණු කරගත් පාඨමාලා ඉදිරිපත් කර ඇති අතර දෙවන වසරේදී ඒ හා සම්බන්ධ ක්‍රම ශිල්ප කෙරෙහි අවධානය යොමු කර ඇත. අවසන් වසර පාඨමාලා ඒකක සැකසී ඇත්තේ ප්‍රතිපත්ති සම්පාදනය හා ඒවා ක්‍රියාවට නැංවීම අරමුණු කරගෙනය.

ඉංග්‍රිසි භාෂාව, තොරතුරු තාක්‍ෂණය, කළමනාකරණ දැනුම සහ මෘදුක කුසලතා වර්ධනය උදෙසා ඉදිරිපත් කර ඇති පොදු විෂය ඒකක රාශියක් ද මෙම පාඨමාලාවට අන්තර්ගත වී තිබේ.

## පාඨමාලා ව්‍යුහය

| පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| **පළමු වසර** | | |
| GEDS 1001 | භෞතික පරිසරය | 05 |
| GEDS 1002 | මානව භූ දර්ශනය | 05 |
| GEDS 1003 | ආර්ථික කටයුතුවල අවකාශීය සංවිධානය | 05 |
| GEDS 1004 | මානව සම්පත් සැලසුම්කරණය | 05 |
| GEDS 1005 | සංවර්ධන සංකල්ප | 05 |
| GEDS 1006 | ප්‍රාදේශීය සංවර්ධනය | 05 |
| ENGE 1005 | අනිවාර්ය ඉංග්‍රීසි | 02 |
| SOSE 1006 | තොරතුරු තාක්ෂණය | 02 |
| **දෙවන වසර** | | |
| GEDS 2001 | සංවර්ධන සැලසුම්කරණය සඳහා සිතියම් විද්‍යාව | 05 |
| GEDS 2002 | ස්වාභාවික සම්පත් කළමනාකරණය | 05 |
| GEDS 2003 | ග්‍රාමීය සංවර්ධනය සහ සැලසුම්කරණය | 05 |
| GEDS 2004 | සංවර්ධන අධ්‍යයන සඳහා සංඛ්‍යානය | 05 |
| GEDS 2005 | සමකාලීන සංවර්ධන ගැටලු | 05 |
| GEDS 2006 | සංවර්ධන සන්නිවේදනය | 05 |
| SOFT 2001 | ශ්‍රී ලාංකේය සමාජය | 02 |
| SOFT 2002 | නායකත්වය හා පෞරුෂ සංවර්ධනය | 02 |

| **පාඨමාලා කේතය** | **පාඨමාලා ඒකකයේ නම** | **ඒකක අගය** |
|---|---|---|
| **තෙවන වසර** | | |
| GEDS 3001 | ආපදා කළමනාකරණය | 05 |
| GEDS 3002 | පාරිසරික ප්‍රතිපත්ති සහ නීති | 05 |
| GEDS 3003 | ප්‍රාදේශීය සැලසුම්කරණය සහ අන්තරාංශ සම්බන්ධීකරණය | 05 |
| GEDS 3004 | නාගරික සැලසුම්කරණය සහ සංවර්ධනය | 05 |
| GEDS 3005 | සංවර්ධන සැලසුම්කරණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධති | 05 |
| GEDS 3006 | සමාජ සුභසාධනය සහ ප්‍රජා සංවර්ධනය | 05 |
| | **මුළු ඒකක අගය** | **98** |

## 6. ඉගැන්නුම් සහ ඉගෙනුම් ක්‍රියාවලිය

බාහිර උපාධි පාඨමාලා සඳහා නියමිත සියලුම පාඨමාලා ඒකක සඳහා අදාල පාඨමාලාවට සම්බන්ධ ආචාර්යවරුන් විසින් ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ. සෑම බාහිර උපාධි පාඨමාලවක එක් විෂයක් සඳහා පැය 40 ක කාලයක් දේශන සහ ප්‍රායෝගික අභ්‍යාස පවත්වනු ලැබේ. ප්‍රායෝගික දේශන හැර සියලු දේශන මාර්ගගත ක්‍රමයට හෝ පටිගත කරන ලද වීඩියෝ පාඩම් වශයෙන් ඉදිරිපත් කෙරේ. මීට අමතරව එක් එක් පාඨමාලා ඒකකයන්ට අදාලව දැනුම පෝෂණය කර ගැනීම පිණිස ස්වයං අධ්‍යයනය සඳහා අවම වශයෙන් පැය 150 ක කාලයක් එක් එක් පාඨමාලා සඳහා වෙන් කළ යුතුය. මේ පිළිබඳව නිසි මාර්ගෝපදේශ අදාල ආචාර්යවරයා විසින් දේශන දැන්වත් කරනු ලැබේ.

වර්තමානයේ දේශන ශාලාවලට කැඳවා සිසුන් අභිමුඛයෙහි සම්මන්ත්‍රණ පැවැත්වීම වෙනුවට විද්‍යුත් මාධ්‍ය උපයෝගී කරගනිමින් විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත. එම ක්‍රමවේදයට අනුව විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පහත සඳහන් ආකාරයෙන් පවත්වනු ලැබේ.

1. සම්මන්ත්‍රණ විඩීයෝගත කර විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය හරහා (LMS) සිසුන් වෙත ලබා දීම.
2. සම්මන්ත්‍රණ පවත්වන අවස්ථාවේදීම මාර්ගගත ක්‍රමයට (Online) සිසුන්ට ඊට සහභාගි වීමට අවස්ථාව සලසා දීම.

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් මෙහෙයවනු ලබන බාහිර උපාධි පාඨමාලාවලට අදාල ඒ ඒ විෂයයන්ට නියමිත විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වෙන ආකාරය පිළිබඳ තොරතුරු මෙන්ම සම්මන්ත්‍රණ පැවැත්වෙන දින සහ වේලාව සඳහන් සම්මන්ත්‍රණ කාල සටහන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කර කල් වේලා ඇතිව සිසුන් දැනුවත් කරනු ලැබේ.

## 7. ඇගයීම් ක්‍රමය

උපාධි පාඨමාලාවේ එක් එක් වර්ෂය සඳහා නියමිත ඉගැන්නුම් සහ ඉගෙනීම් ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අවසන් වූ පසුව අවසන් පරීක්ෂණ පවත්වනු ලැබේ. එක් එක් පාඨමාලාවට අදාලව ලිඛිත හෝ ප්‍රායෝගික පරීක්ෂණ පවත්වනු ලබන ආකාරය, පැය ගණන හා වෙනත් විස්තර සවිස්තරාත්මක විෂය නිර්දේශයන්හි දක්වා ඇති අතර අදාල විෂය භාර ආචාර්යවරුන් විසින් ද මේ පිළිබඳව දැනුවත් කරනු ලැබේ. ඇතැම් පාඨමාලා සඳහා ඇගයීම් ක්‍රමය වශයෙන් වර්ෂාවසාන ලිඛිත හෝ ප්‍රායෝගික පරක්ෂණයක් පමණක් පවත්වනු ලබන අතර ඇතැම් පාඨමාලා ඒකක සඳහා වර්ෂාවසාන පරීක්ෂණයට අමතරව අඛණ්ඩ ඇගයීමේ ක්‍රමයට අනුකූලව පැවරුම් ලබා දීම සිදු කෙරේ. එබඳු අවස්ථාවක දී අදාල **පාඨමාලා ඒකකය සම්පූර්ණ කර ශ්‍රේණියක් ලබා ගැනීම සඳහා එම අවස්ථා දෙකම සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.**

## 7.1 අඛණ්ඩ ඇගයීම්

අඛණ්ඩ ඇගයීම් යන්නෙන් අදහස් වන්නේ අදාල පාඨමාලා ඒකකයේ ඉගැන්නුම් සහ ඉගෙනුම් ක්‍රියාවලිය ආරම්භයේ පටන් අවසන් පරීක්‍ෂණය පවත්වන තෙක් එක් ක්‍රමවේදයක් හෝ ක්‍රමවේද කිහිපයක් භාවිතයෙන් විෂය නිර්දේශයේ දක්වා ඇති ලකුණු සීමාවට අදාලව පවත්වනු ලබන ඇගයීමයි. මධ්‍ය අර්ධ වාර්ෂික පරීක්ෂණය/ ඉදිරිපත් කිරීම් /වාචික පරීක්ෂණ / ප්‍රායෝගික පරීක්ෂණ / ක්ෂේත්‍ර අධ්‍යයන හා සම්බන්ධ පැවරුම් හෝ වෙනත් නිර්දේශිත ක්‍රමයක් යන එකකින් හෝ කිහිපයකින් මෙය සමන්විත විය හැකිය. කිසියම් පාඨමාලා ඒකකයකට අයත් ඇගයීම් ලබාදීම හෝ ඇගයීම් පටිපාටිය පිළිබඳ දැන්වත් කිරීම් අදාල පාඨමාලා ඒකකය භාර ආචාර්යවරයා විසින් සිදු කරනු ලැබේ. යම් උපාධි අපේක්ෂකයෙක් වර්ෂාවසාන පරීක්ෂණයට පමණක් පෙනීසිට අඛණ්ඩ ඇගයීම් සිදු නොකර ඇති අවස්ථාවක දී අවසන් පරීක්‍ෂණයෙන් සමත් වීමේ ප්‍රමාණවත් ලකුණු ලබා තිබුණ ද එම පාඨමාලා ඒකකය අසමත් ලෙස සලකනු ලැබේ.

අඛණ්ඩ ඇගයීම සමත්වීමට නම් අදාල පාඨමාලාව මගින් නිර්දේශිත අඛණ්ඩ ඇගයීම් සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් 40% වත් ලකුණු ලබා තිබිය යුතු ය. එක් පරීක්‍ෂණ අවස්ථාවක් සඳහා උපයාගත් අඛණ්ඩ ඇගයීම් එකී පරීක්‍ෂණය පැවැත්වෙන අවස්ථාවට මිස වෙනත් පරීක්‍ෂණ අවස්ථා සඳහා සලකා බලනු නොලැබේ.

යම් පාඨමාලා ඒකකයක අවසාන පරීක්ෂණයට පෙනී සිට අසමත් වූ ශිෂ්‍යයකු පුනර් අපේක්ෂකයකු ලෙස නැවත විභාගය සඳහා පෙනී සිටිමේදී ඊට පෙර පැවති පරීක්ෂණයකදී එම පාඨමාලා ඒකකයට අදාළ අඛණ්ඩ ඇගයීම් සඳහා ලබාගත් ලකුණු ගණනය කරනු නොලැබේ. ඒ අනුව පුනර් අපේක්ෂකයින් වශයෙන් පෙනී සිටින සිසුන් සඳහා අවසන් පරීක්ෂණය පමණක් පදනම් කරගනිමින් ලකුණු ලබා දීම සිදුකෙරේ.

අදාල ආචාර්යවරයාගේ උපදෙස් පරිදි එක් එක් පාඨමාලා ඒකකවලට අදාල පැවරුම් නිසි පරිදි භාරදීමේ වගකීම උපාධි අපේක්ෂකයන් විසින් දැරිය යුතු ය. එය පරීක්‍ෂණයේ කොටසක් බැවින් සියලුම විභාග නීති රීති පැවරුම් සම්බන්ධයෙන් ද අදාල වේ. බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට හෝ එම ඒකකය විසින් පවරනු ලබන අයෙකුට පැවරුම් භාර දෙන්නේ නම් එසේ භාර දුන් බවට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයෙන් ලබාදෙන ලේඛනයේ අත්සන් තබා තහවුරු කරගත යුතුය. අධ්‍යයනාංශය හෝ පාඨමාලා ඒකකය භාර ආචාර්යවරයා වග කියනු ලබන්නේ එකී නියමිත කාර්යය පටිපාටිය අනුගමනය කර අධ්‍යයනාංශය හෝ බාහිර විභාග අංශය වෙත භාරදෙනු ලබන පැවරුම් සම්බන්ධයෙන් පමණි.

## 7.2 අවසාන පරීක්ෂණය

සෑම පාඨමාලා ඒකකයක් සඳහාම අධ්‍යයන වර්ෂය අවසානයේදී පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එක් එක් පාඨමාලා ඒකකවල ආවශ්‍යකතාවන්ට අනුව අවසාන පරීක්ෂණවල කාලය වෙනස් විය හැකිය.

සාමාන්‍යයෙන් අවසාන පරීක්ෂණය සඳහා නියමිත ප්‍රශ්න පත්‍රයට හිමි කාලය පැය තුනකි. අවසාන පරීක්ෂණය සඳහා අඛණ්ඩ ඇගයීම් නිර්දේශ කර නොමැති පාඨමාලාවක ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100% ක් හිමි වන අතර, අඛණ්ඩ ඇගයීම් නිර්දේශිත පාඨමාලාවක අවසාන පරීක්‍ෂණය සඳහා අදාල පරිදි ලකුණු 60% - 80%ක් හිමි වේ.

## 8. ශ්‍රේණි පටිපාටිය සහ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA)

සියලුම බාහිර උපාධි පාඨමාලාවන්හි ඇගයීම් ක්‍රියාවලියේ දී පහත වගුවේ දැක්වෙන පරිදි ශ්‍රේණි අක්ෂර සහ සංකේත භාවිත කරනු ලැබේ. ශ්‍රේණි ලකුණු සාමාන්‍යය යනු කිසියම් බාහිර උපාධි අපේක්ෂකයකු තම උපාධි පාඨමාලාව තුළදී සම්පූර්ණ කරන ලද පාඨමාලා ඒකක සඳහා ලබා ගත් ශ්‍රේණිවලට ආරෝපණය කරනු ලබන ලකුණු එම ඒකකයන්ගේ ඒකක අගයෙන් බර තැබීම මගින් ගණනය කරනු ලබන සාමාන්‍ය අගයයි.

- E ශ්‍රේණිය රහිත GPA අගය 2ට වැඩි නම් සමත් ලෙස සලකනු ලැබේ.
- GPA අගය 2ට අඩු නම් අසමත් ලෙස සලකනු ලැබේ.
-

| ලකුණු | ශ්‍රේණි/ සංකේත | ඒකක අගය | විස්තරය |
|---|---|---|---|
| 85 -100 | A+ | 4.00 | විශිෂ්ටයි |
| 70 - 84 | A | 4.00 | |
| 65 - 69 | A- | 3.70 | හොඳයි |
| 60 - 64 | B+ | 3.30 | |
| 55 - 59 | B | 3.00 | |
| 50 - 54 | B- | 2.70 | සතුටුදායකයි |
| 45 - 49 | C+ | 2.30 | |
| 40 - 44 | C | 2.00 | |
| 35 - 39 | C- | 1.70 | අසතුටුදායකයි |
| 30 - 34 | D+ | 1.30 | |
| 25 - 29 | D | 1.00 | |
| 0 - 24 | E | 0.00 | |
| - | AB | අදාල නොවේ | නොපැමිණි |
| | EXL | | බැහැර කළ |
| - | DFR | | කල් දැමූ |
| - | MC | | වෛද්‍ය හේතු මත පෙනී නොසිටි |

## 8.1 ශ්‍රේණි ලකුණු ගණනය කරන ආකාරය

**උදාහරණය - ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව**

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ලබා ගත් ශ්‍රේණිය | උපයා ගත් ශ්‍රේණි ලකුණු | ඒකක අගය | උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම |
|---|---|---|---|---|---|
| BCGE 1001.4 | භාරතීය බෞද්ධ ශිෂ්ටාචාරයෙහි ප්‍රභවය හා පරිහානිය | **B** | 3.00 | 4 | 12 |
| BCGE 1002.4 | මූලධර්ම අධ්‍යයනය | **B** | 3.00 | 4 | 12 |
| ECGE 1001.4 | සූක්ෂම ආර්ථික විද්‍යා මූලධර්ම | **A+** | 4.00 | 4 | 16 |
| ECGE 1002.4 | සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම | **A -** | 3.70 | 4 | 14.8 |
| SOGE 1001.4 | සමාජ විද්‍යා මූලික සංකල්ප | **B+** | 3.30 | 4 | 13.2 |
| SOGE 1002.4 | සමකාලීන සමාජය හා සමාජ වෙනස්වීම | **C** | 2.00 | 4 | 08 |
| GENG 1005.3 | English in Use I | **C** | 2.00 | 3 | 06 |
| GEIT 1001.3 | Introduction to Information and Commiunication Technology | **C** | 2.00 | 3 | 06 |
| SOFT 1001.2 | ශ්‍රී ලාංකේය සමාජය | **C** | 2.00 | 2 | 04 |
| එකතුව | | | | 32 | 92 |

$$GPA = \frac{\sum_{i=1}^{N} \left[(\text{ඒකක අගය})_i * (\text{උපයාගත් ශ්‍රේණි ලකුණ})_i\right]}{\sum_{i=1}^{N} (\text{ඒකක අගය})_i}$$

$$GPA = \frac{\text{උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම් එකතුව}}{\text{ඒකක අගය එකතුව}} = \frac{92}{32} = 2.875$$

මෙම උදාහරණයට අනුව උපාධියෙහි අවසන් ශ්‍රේණි ලකුණු අගය වන්නේ 2.87 කි. ඒ අනුව මෙම සිසුවා සමත් වේ.

## 8.2 අවසන් ශ්‍රේණි ලකුණු ගණනය කළ විට අසමත් ශ්‍රේණි අගයන් දක්වන උදාහරණයක් පහත දැක්වේ

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ලබා ගත් ශ්‍රේණිය | උපයා ගත් ශ්‍රේණි ලකුණු | ඒකක අගය | උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම |
|---|---|---|---|---|---|
| BCGE 1001.4 | භාරතීය බෞද්ධ ශිෂ්ටාචාරයෙහි ප්‍රභවය හා පරිහානිය | **C** | 2.00 | 4 | 08 |
| BCGE 1002.4 | මූලධර්ම අධ්‍යයනය | **C** | 2.00 | 4 | 08 |
| ECGE 1001.4 | සූක්ෂම ආර්ථික විද්‍යා මූලධර්ම | **D** | 1.00 | 4 | 04 |
| ECGE 1002.4 | සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම | **C -** | 1.70 | 4 | 6.8 |
| SOGE 1001.4 | සමාජ විද්‍යා මූලික සංකල්ප | **C+** | 2.30 | 4 | 9.2 |
| SOGE 1002.4 | සමකාලීන සමාජය හා සමාජ වෙනස්වීම | **C** | 2.00 | 4 | 08 |
| GENG 1005.3 | English in Use I | **C** | 2.00 | 3 | 06 |
| GEIT 1001.3 | Introduction to Information and Commiunication Technology | **C** | 2.00 | 3 | 06 |
| SOFT 1001.2 | ශ්‍රී ලාංකේය සමාජය | **C** | 2.00 | 2 | 04 |
| එකතුව | | | | 32 | 60 |

$$GPA = \frac{\sum_{i=1}^{N} \left[ (\text{ඒකක අගය})_i * (\text{උපයාගත් ශ්‍රේණි ලකුණු})_i \right]}{\sum_{i=1}^{N} (\text{ඒකක අගය})_i}$$

$$GPA = \frac{\text{උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම් එකතුව}}{\text{ඒකක අගය එකතුව}} = \frac{60}{32} = 1.875$$

මෙම උදාහරණයට අනුව උපාධියෙහි අවසන් ශ්‍රේණි ලකුණු අගය වන්නේ 1.87 කි. ඒ අනුව මෙම සිසුවා අසමත් වේ.

# 9. විභාග නිර්ණායක (GPA) සහ උපාධි ආවශ්‍යකතා

## 9.1 විභාග නිර්ණායක

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සියලුම බාහිර උපාධි අපේක්ෂකයන් ඔවුන් ලියාපදිංචි වී ඇති පාඨමාලාවට අදාල ආවශ්‍යකතා සපුරාලිය යුතු අතර සතුටුදායක අධ්‍යයන ප්‍රගතියක්ද පෙන්නුම් කළ යුතු වේ. මේ සඳහා අදාල වන විභාග නිර්ණායක පහත අංක යටතේ දැක්වේ.

## 9.2 පාඨමාලා ඒකකයක් සමත් වීම

උපාධි අපේක්ෂකයකු කිසියම් පාඨමාලා ඒකකයකින් C හෝ ඊට ඉහළ ශ්‍රේණියක් ලබා ඇත්නම් එම පාඨමාලා ඒකකයෙන් සමත් ලෙස සැලකෙන අතර D, D+ සහ C- යන ශ්‍රේණි ඌන සාමර්ථ්‍ය ශ්‍රේණි ලෙස සැලකේ.

උපාධි අපේක්ෂකයකු කිසියම් පාඨමාලා ඒකකයක් සඳහා E, AB සහ FAIL ශ්‍රේණි ලබා ඇත්නම් එම පාඨමාලා ඒකකය අසමත් යැයි සැලකේ. උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීමට එලෙස අසමත් වන සියලු පාඨමාලා ඒකක සමත් වීම අනිවාර්ය වේ.

## 9.3 වර්ෂ අවසාන විභාගයට පෙනී නොසිටීමට හේතු වාර්තා කිරීම

අවසාන විභාගයට පෙනී නොසිටීමට බලපාන හේතු පහත සංකේතයන්ගෙන් දැක්වේ.

- වෛද්‍ය හේතු මත විභාගයට පෙනී නොසිටීම MC
- පිළිගත හැකි හේතු මත විභාගයට පෙනී නොසිට කල් ගැනීම DFR
- පිළිගත හැකි හේතුවක් නොමැතිව විභාගයට පෙනී නොසිටීම AB (මෙම තත්ත්වය පාඨමාලා ඒකකය අසමත් වීමක් ලෙස සලකනු ලැබේ.)
- පාඨමාලාවෙන් බැහැර කළ අවස්ථාවේදී EXL

## 9.4 විභාගයට පෙනී නොසිටීම සඳහා පිළිගත් හේතු

උපාධි අපේක්‍ෂකයා බරපතළ ලෙස රෝගාතුර වීම, උපාධි අපේක්ෂකයාගේ මව, පියා, දරුවන්, කලත්‍රයා, සහෝදර සහෝදරියන්ගේ අභාවය, උපාධි අපේක්ෂකයාගේ විවාහය හෝ සනාතන සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් හේතුවක් පරීක්‍ෂණ සඳහා පෙනී නොසිටීමට පිළිගත හැකි හේතුවක් වේ. එබඳු අවස්ථාවක දී අදාල ප්‍රශ්න පත්‍රය සඳහා **විභාගය පැවැත්වෙන දින සිට දින 14ක් ඇතුළත රජයේ රෝහලකින් ලබා ගත් වෛද්‍ය සහතිකයක් සමඟ අප වෙබ් අඩවියෙහි ඇති අයදුම්පතද සහිතව බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ඉදිරිපත් කර විභාගය සඳහා පෙනී නොසිටීමට හේතුව තහවුරු කළ යුතුය.**

වෛද්‍ය සහතිකය ලබා ගෙන ඇත්තේ රජයේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වෛද්‍යවරයකුගෙන් නම් එය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි මගින් සහතික කරවා ගත යුතු අතර, වෛද්‍ය සහතිකය ලබා ගෙන ඇත්තේ **ආයුර්වේද වෛද්‍යවරයකුගෙන් නම් එය රජයේ ආයුර්වේද රෝහලක වෛද්‍ය නිලධාරියකු මගින් සහතික කරවා ගත යුතුය.**

උපාධි අපේකෂකයාගේ විවාහය, විදේශගත වීම, පවුලේ ළඟම සාමාජිකයෙකුගේ අභාවයකදී ඊට අදාළ වන විභාගයට පෙනී නොසිටීම සනාථ කිරීමට වලංගු ලේඛන (විවාහ සහතික, වීසා බලපත්‍ර, විදේශ ගමන් බලපත්‍ර, පවුලේ ළඟම සාමාජිකයෙකුගේ අභාවයකදී නිසි පරිදි සහතික කළ මරණ සහතිකයක් ඥාතිත්වය තහවුරු කිරීමේ සහතික) හෝ පිළිගත් වෛද්‍ය සහතික බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය. (අවමංගල්‍ය ශෝක ප්‍රකාශ මරණ සහතික ලෙස පිළිගනු නොලැබේ.) එසේ ඉදිරිපත් කරන ලේඛන මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශයෙන් පසුව සනාතන සභාව විසින් අනුමත කළ යුතුය. වෛද්‍ය සහතිකය පිළිගත හැකි එකක් නම් පාඨමාලා ඒකකය සඳහා උපාධි අපේක්ෂකයාට MC සංකේතය ලැබේ. මෙය පළමුවර පෙනී සිටීමක් ලෙස සලකා නැවත අදාල පාඨමාලා ඒකකය සඳහා විභාගයට පෙනී සිටීමට සුදුසුකමක් වන අතර අදාළ විෂය ඒකකයට නැවත පරීක්ෂණයක් පවත්වන ප්‍රථම අවස්ථාවේ එයට පෙනී සිටිය යුතු වේ. එමෙන්ම නැවත පරීක්ෂණයට අයදුම් කරන විට නියමිත විභාග ගාස්තු ගෙවා අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර MC සංකේතය ලැබීමෙන් විභාග ගාස්තු නිදහස් කිරීමක් සිදු නොවේ. කෙසේ වුවද නැවත විභාගයට පෙනී සිටීමේදී පාඨමාලා ඒකකයට අදාල සියලුම ඇගයීම් සම්පූර්ණ කළ යුතුය.

## 9.5 පුනර් පරීක්ෂණ

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ අධ්‍යයන මණ්ඩලයේ සහ පීඨ මණ්ඩලයේ නිර්දේශයෙන් පසුව සනාතන සභාව අනුමත කරනු ලබන විශේෂ තත්ත්වයකදී හැර E ශ්‍රේණියක් සහිතව පාඨමාලා ඒකකයකට පෙනී සිටින උපාධි අපේක්ෂකයන් එම ඒකකය සඳහා නැවත පරීක්‍ෂණයක් පවත්වනු ලබන ප්‍රථම අවස්ථාවේදීම එයට පෙනී සිටිය යුතුය. උපාධි අපේක්ෂකයකු D, D+, C- යන ශ්‍රේණි ලබා ඇති අවස්ථාවක දී එම පාඨමාලාව සඳහා විභාගය නැවත පැවැත්වෙන ප්‍රථම අවස්ථාවේ දී නැවත පෙනී සිටිය හැකිය.

පාඨමාලා ඒකකයකින් අසමත්ව නැවත පෙනී සිටින අපේක්ෂකයකුට ලබා ගත හැකි උපරිම ශ්‍රේණිය C වේ. පුනර් පරීක්ෂණයකදී කලින් ලබා ගත් ශ්‍රේණියට වඩා අඩු ශ්‍රේණියක් ලබා ගෙන ඇති අවස්ථාවකදී කලින් ලබා ගෙන ඇති ඉහළම ශ්‍රේණිය උපාධි අපේක්ෂකයාට හිමි වේ. එමෙන්ම යම් විෂයය ඒකකයකට පරීක්ෂණය පවත්වන ප්‍රථම අවස්ථාවේ අයදුම් කර පෙනී නොසිටියේ නම් සහ අයදුම් නොකර සිටියේ නම් අදාළ විෂය ඒකකයට නැවත පෙනී සිට ලබා ගත හැකි උපරිම ශ්‍රේණිය C වේ.

## 9.6 වර්ෂ අවසාන විභාගය සඳහා පුනර් පරීක්ෂණ

සනාතන සභාව විසින් නියම කරනු ලබන අවස්ථාවකදී හැර **වර්ෂ අවසාන පුනර් පරීක්ෂණයක් එම වර්ෂය තුළදී ම නොපැවැත්වේ.** වර්ෂ අවසාන පරීක්ෂණයට නැවත පෙනී සිටින උපාධි අපේක්ෂකයකු නැවත එම විභාගය පැවැත්වෙන ප්‍රථම අවස්ථාවේදීම ඒ සඳහා පෙනී සිටිය යුතුය. කලින් අවස්ථාවල අඛණ්ඩ ඇගයීම් සඳහා උපයා ගත් ලකුණු එම පාඨමාලා ඒකකයටම **නැවත පෙනී සිටීමේදී සැළකිල්ලට ගනු නොලැබේ.**

## 9.7 උපාධි ආවශ්‍යකතා

බාහිර උපාධිය ලබා ගැනීම සඳහා පහත සඳහන් ආවශ්‍යකතා සම්පූර්ණ කළ යුතුය.

- ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය ලබා ගැනීම සඳහා අවම වශයෙන් ඒකක අගය **97** ක් වන පරිදි පාඨමාලා ඒකක සංඛ්‍යාවක් සම්පූර්ණ කළ යුතුය.
- සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සහ ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය ලබා ගැනීම සඳහා අවම වශයෙන් ඒකක අගය **98** ක් වන පරිදි පාඨමාලා ඒකක සංඛ්‍යාවක් සම්පූර්ණ කළ යුතුය.
- එක් එක් අධ්‍යයන වර්ෂ සඳහා සහ සමස්ත උපාධි පාඨමාලාව සඳහා **2.00** ට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය.
- අසමත් ශ්‍රේණිය (E) සහ විභාගයට පෙනී නොසිටීමේ සංකේතය (AB) නොතිබිය යුතුය.

## 10. පන්ති සාමර්ථ්‍යය ප්‍රදානය

බාහිර උපාධි පාඨමාලා සඳහා පන්ති සාමර්ථ්‍ය ලැබීමේ ආවශ්‍යකතා පහත දැක්වේ.

### 10.1 පළමු පෙළ පන්ති සාමර්ථ්‍යය

පළමු පෙළ පන්ති සාමර්ථ්‍යයක් ප්‍රදානය කිරීම සඳහා:

- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ සහ සනාතන සභාවේ අනුමැතියට යටත්ව පිළිගත හැකි වලංගු හේතුවක් ඇති අවස්ථාවකදී හැර පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුනක් ඇතුළත උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා **3.70** ට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) ලබා ගත යුතුය.
- අසමත් ශ්‍රේණිය E සහ විභාගයට පෙනී නොසිටීමේ සංකේතය (AB) නොතිබිය යුතුය.
- අනිවාර්ය විෂය ඒකක සියල්ල සමත් විය යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා C ශ්‍රේණියට පහළ ශ්‍රේණි නොතිබිය යුතු ය.
- සමස්ත උපාධි පාඨමාලාවට අදාල විෂය ඒකකයන්ගෙන් අඩකටවත් අවම වශයෙන් A සාමර්ථ්‍ය උපයාගෙන තිබිය යුතුය.

### 10.2 දෙවන පෙළ (ඉහළ) පන්ති සාමර්ථ්‍යය

දෙවන පෙළ (ඉහළ) පන්ති සාමර්ථ්‍යයක් ප්‍රදානය කිරීම සඳහා:

- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ සහ සනාතන සභාවේ අනුමැතියට යටත්ව පිළිගත හැකි වලංගු හේතුවක් ඇති අවස්ථාවකදී හැර පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුනක් ඇතුළත උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා **3.30** ට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් ලබා ගත යුතුය.
- අසමත් ශ්‍රේණිය E සහ විභාගයට පෙනී නොසිටීමේ සංකේතය (AB) නොතිබිය යුතුය.

## 10.3 දෙවන පෙළ (පහළ) පන්ති සාමර්ථ්‍යය

දෙවන පෙළ (පහළ) පන්ති සාමර්ථ්‍යයක් ප්‍රදානය කිරීම සඳහා:

- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ සහ සනාතන සභාවේ අනුමැතියට යටත්ව පිළිගත හැකි වලංගු හේතුවක් ඇති අවස්ථාවකදී හැර පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුනක් ඇතුළත උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා 3.00ට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් ලබා ගත යුතුය.
- අසමත් ශ්‍රේණිය E සහ විභාගයට පෙනී නොසිටීමේ සංකේතය (AB) නොතිබිය යුතුය.

## 10.4 සාමාන්‍ය සාමර්ථ්‍යය

සාමාන්‍ය සාමර්ථ්‍යයක් ප්‍රදානය කිරීම සඳහා:

- සමස්ත උපාධි පාඨමාලාව සඳහා 2.00ට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය.
- අසමත් ශ්‍රේණිය E සහ විභාගයට පෙනී නොසිටීමේ සංකේතය (AB) නොතිබිය යුතුය.

## 10.5 පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය

පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය සඳහා කැමැත්තක් දක්වන සිසුන් විභාග ප්‍රතිඵල නිකුත් කර දින 14 ක් ඇතුළත ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. අදාල විස්තර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ.

## 11. විභාග අක්‍රමිකතා

බාහිර විභාග සඳහා පෙනී සිටින අපේක්ෂකයන් වෙත අභ්‍යන්තර සිසුන්ට අදාල විභාග අක්‍රමිකතා පිළිබඳව පවතින විනය පටිපාටිය එලෙසින්ම මෙම උපාධි පාඨමාලාව සඳහා ද ක්‍රියාත්මක වේ. විභාග ශාලාව තුළ විනය පවත්වාගෙන යාම සඳහා සෑම අපේක්ෂකයකුම සහාය විය යුතු වේ. පහත දක්වා ඇති විභාග අක්‍රමිකතා සිදුකිරීම බලවත් වරදක් වන අතර එවැනි විෂමාචාර ක්‍රියාවක යෙදුනහොත් විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් පනවා ඇති දඬුවම්වලට අපේක්ෂකයන් යටත්වනු ඇත. සියලු විභාග වලට පෙනී සිටින අපේක්ෂකයින් සඳහා විභාග පැවැත්වීමේ පටිපාටිය, විභාග අක්‍රමිකතා සහ දඬුවම් පිළිබඳ නීතිරීති සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 292 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද ලේඛනය වෙබ්අඩවියේ පළකර ඇත.

### 11.1 විභාග අක්‍රමිකතා ලෙස සැලකෙන කරුණු

- සෙලියුලර් දුරකථන හෝ වෙනත් සන්නිවේදන උපකරණ පිළිතුරු ලියන අවස්ථාවේ ළඟ තබා ගැනීම සහ භාවිත කිරීම.
- ලිපිලේඛන සහ බල නොලත් වෙනත් ලේඛන සන්තකයේ තබා ගැනීම.
- විභාග ශාලාවේ දී විශ්වවිද්‍යාලය මගින් සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා ලේඛන ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම.
- පිළිතුරු ලිවීම සඳහා වෙනත් අයගෙන් උදව් ලබා ගැනීම.
- විභාග අපේක්ෂකයකු තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම.
- ප්‍රශ්න පත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැන ගැනීමට තැත් කිරීම.
- විභාග සම්බන්ධ යම් වරදක් කිරීමට ආධාර අනුබල ලබාදීම හා ලබා ගැනීම.
- විභාග ශාලාධිපතිට, නිරීක්ෂකවරුන්ට හෝ අනෙකුත් විභාග නිලධාරීන්ට බලපෑම් කිරීම.
- අසංවර හැසිරීම්, අනිසි බලපෑම් හා වෙනත් වංචනික ක්‍රියා සිදු කිරීම.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් විභාග අක්‍රමිකතාවක් ලෙස සැලකෙන වෙනත් ඕනෑම විභාග වංචනික ක්‍රියාවක් සිදු කිරීම.

### 11.2 විභාග අක්‍රමිකතා සඳහා ක්‍රියාත්මක දඬුවම්

- විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම.
- ලියාපදිංචිය අත්හිටුවීම/අවලංගු කිරීම.
- දඩයක් සහිතව හෝ රහිතව කිසියම් කාල සීමාවකට යටත්ව විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- පන්ති සාමර්ථ්‍යයක් නො දීම.
- අවලංගු කළ ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටීමේදී ලකුණු 40 ක උපරිමයකට සීමා කිරීම
- උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි කරවා නොගැනීම.
- උපාධි ප්‍රදානය හා ප්‍රතිඵල නිකුත්කිරීම වර්ෂයකින් ප්‍රමාද කිරීම.
- විශ්වවිද්‍යාල සනාතන සභාව මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් දඬුවම් ආදිය වේ.

## 12. උපාධිය වලංගු වන දිනය

ප්‍රථමවරට උපාධි III පරීක්ෂණයට පෙනී සිටින සිසුන් සඳහා, උපාධිය වලංගු වන දිනය **උපාධි III පරීක්ෂණයේ අවසන් දිනට පසුව එළඹෙන** (ඉරිදාවක් හෝ රජයේ නිවාඩු දිනයක් නොවන) **රාජකාරී දිනය වේ.**

### 12.1 උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් වාර්ෂිකව පවත්වනු ලබන බාහිර උපාධි ප්‍රදානෝත්සවයේ දී ඒ වනවිට සිය උපාධි ආවශ්‍යකතා සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින් ට උපාධි ප්‍රදානය කරනු ලැබේ. උපාධි ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව සනාතන සභා අනුමැතියට යටත්ව, සමත්වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා තාවකාලික සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ. උපාධි ප්‍රදානෝත්සවයට ඉල්ලුම් කිරීම හා විධිමත් උපාධි සහතිකයට අදාල ඉල්ලුම් පත්‍ර වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. උපාධි ප්‍රදානෝත්සවය සඳහා කැඳවනු ලබන්නේ අයැදුම් කළහොත් පමණි. වාර්ෂිකව පැවැත්වෙන උපාධි ප්‍රදානෝත්සවයේදී අදාල අයදුම්කරුට විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ/ උපකුලපති අතින් උපාධිය ප්‍රදානය කෙරේ. යම් අයැදුම්කරුවකුට උපාධි ප්‍රදානෝත්සවයේ දී අභිමුඛයේ හෝ අනභිමුඛයේ උපාධි ලබාගත හැකිය. උපාධි ප්‍රදානෝත්සවයේ දී ප්‍රදානය කරනු ලබන මුල් සහතිකයේ පිටපත් හෝ අනුපිටපත් නැවත නිකුත් කරනු නො ලැබේ. උපාධි ප්‍රදානෝත්සවය සඳහා අභිමුඛයේ හෝ අනභිමුඛයේ ඉදිරිපත්වන උපාධිලාභීන් සඳහා උපාධි ලෝගුව සහ සාටකය නැවත විශ්වවිද්‍යාලයට භාර දී ඒ බව වාර්තා පොතේ සටහන් කරවා ගතයුතුය.

## 12.2 බාහිර උපාධි අපේක්ෂකයන්ගේ විශේෂ අවධානය පිණිසයි.

1. බාහිර උපාධි පාඨමාලා සඳහා දේශන පවත්වන ආයතනයක, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකු සේවය කරන්නේ නම්, ඔහු හෝ ඇය ප්‍රශ්න පත්‍ර සකස් කිරීමට, පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීමට හෝ කිසිදු විභාග පරීක්ෂණ කටයුත්තක් සඳහා සහභාගි කරගනු නො ලැබේ.

2. විශ්වවිද්‍යාලයේ අධීක්ෂණය යටතේ අධ්‍යයනාංශ ප්‍රධානවරුන්ගේ හා පීඨාධිපතිතුමාගේ නිර්දේශයන් හා අධ්‍යයන මණ්ඩලයේ හා පීඨමණ්ඩලයේ අනුමැතිය මත පමණක් දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීමට හැකිය.

3. මෙම අත්පොතේ සඳහන් ඕනෑම කරුණක් පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සතු වේ.

4. මෙම ශිෂ්‍ය අත්පොතේ සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගත යුතු අතර, අදාල උපාධි පාඨමාලාව හදාරා අවසන් වනතුරු මෙම අත්පොත සුරැකිව තබාගෙන ඊට අනුව කටයුතු කරන ලෙස ද උපදෙස් දෙනු ලැබේ.

5. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පිරිනමනු ලබන සියලුම බාහිර උපාධි පාඨමාලා ලියාපදිංචි කිරීමේ සිට සියලුම කටයුතු මෙහෙයවනු ලබන්නේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මඟින් වන අතර එම කිසිදු කාර්යයක් සම්බන්ධයෙන් වෙනත් කිසිඳු ආයතනයක මැදිහත් වීමක් සිදු නොවන බවත් එවැනි ආයතනයන්ට මුදල් ගෙවීම් සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ කිසිඳු වගකීමක් නොමැත.

**සියලුම බාහර උපාධි පාඨමාලාවන්ට අදාල වාරික ගෙවීමේ අයදුම්පත්, සම්මන්ත්‍රණ කාලසටහන්, පරීක්ෂණ කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර, ලියාපදිංචිය දීර්ඝ කිරීම සහ උපාධි ප්‍රදානෝත්සවය ආදී සියලු කටයුතු සඳහා දැනුවත් කිරීම් www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවිය ඔස්සේ පමණක් සිදුකරනු ලැබේ. තැපැල් මගින් ලිපි එවනු නොලැබේ. එබැවින් නිතර නිතර අපගේ වෙබ් අඩවිය වෙත පිවිස අදාල ශීර්ෂ යටතේ ඇති නිවේදන පිළිබඳ දැනුවත් වීම අනිවාර්ය වේ.**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
නො 616 එල්ලාවල ගොඩනැගිල්ල
හයිලෙවල් පාර
විජේරාම නුගේගොඩ

වෙබ් අඩවිය :www.external.sjp.ac.lk
විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය :learnext.sjp.ac.lk
විද්‍යුත් ලිපිනය :info.ext@sjp.ac.lk
දුරකථන අංකය :0112801481
:0113132496